වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT
2018



ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

இலங்கை தேசிய திரைப்படக் கூட்டுத்தாபனம்

NATIONAL FILM CORPORATION OF SRI LANKA

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව



වාර්ෂික වාර්තාව

2018

පිළිගැන්වීම

මගේ අංක NFC/119/01/02/02

ලේකම්
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මගින්

ගරු විදුර වික්‍රමනායක මැතිතුමා
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
8 වන මහල
සෙත්සිරිපාය
බත්තරමුල්ල

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව - වාර්ෂික වාර්තාව -2018

1980 අංක 45 දරණ පනතින් සංශෝධිත 1971 අංක 47 දරණ ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32 (1) වගන්තිය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව 2018 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා පහත සඳහන් ලේඛනයන්ද සමග සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

1. 2018 වසරේ සංස්ථාව විසින් කරන ලද කාර්යයන් හා අදාල ප්‍රකාශ
2. 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා සංස්ථාවේ ලාභලාභ ගිණුම්, ආශ්‍රිත සටහන් හා එදිනට ශේෂ පත්‍රය
3. 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා විගණකාධිපති වාර්තාව

මෙයට විශ්වාසී වූ

ජී. ඒ. කිත්සිරි
සාමාන්‍යාධිකාරී
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

පාලන වාර්තාව

01. හැඳින්වීම

02. අධ්‍යක්ෂ මණ්ඩලය

03. දේශීය චිත්‍රපට නිෂ්පාදනය

04. පිරිස් හා ආයතන පාලනය

05. චිත්‍රපට ප්‍රචාරණය/ සිනේ ඇඩිස්

06. සිනමා සංස්කෘතිය හා අධ්‍යාපන කටයුතු

07. චිත්‍රපට බෙදාහැරීම් හා ගබඩා

08. නෛතික කටයුතු

09. මූල්‍ය කටයුතු

10. චිත්‍රාගාරය

11. පරීක්ෂණ කටයුතු

12. සැලසුම්, සංඛ්‍යාලේඛන හා පුහුණු

13. වෛද්‍ය සහනාධාර ක්‍රමය

14. සුභ සාධනය

15. ආගමික කටයුතු

16. ක්‍රීඩා සංගමය

17. වෘත්තීය සමිති

18. ස්තූතිය

01.හැදින්වීම

1980 අංක 45 දරණ පනතින් සංශෝධනය කල 1971 අංක 47 දරණ ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32 (1) වගන්තිය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (1) වගන්තිය යටතේගරු අග්‍රාමාත්‍ය බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාහා විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2018 වර්ෂය පිළිබඳ වාර්තාව.

2018 වර්ෂය පිළිබඳ ඉදිරිපත් කරන මෙම වාර්තාව ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 46 වන ක්‍රියාත්මක වර්ෂයට අදාල වේ.

02.අධ්‍යක්ෂ මණ්ඩලය

2018 වර්ෂය තුළ ජාතික චිත්‍රපට සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ.

2018 ජනවාරි මස 01 දින සිට 2018 දෙසැම්බර් 31 දක්වා පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වූ අධ්‍යක්ෂ මණ්ඩලය අමාත්‍යාංශ විෂය පථ මාරුවීමත් සමග අංක 1 – 4 දක්වා සඳහන් කර ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය පත්කර ඇත.

අංක 1 : 2018.01.01 සිට 2018.06.06 දක්වා

1. සිතේන්ද්‍ර සේනාරත්න මහතා - සභාපති
2. ආනන්ද බණ්ඩාර දිසානායක මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ
3. නීතිඥ සුදර්ශන ගුණවර්ධන මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිලබලයෙන්)
4. අනුෂා ගෝකුල ප්‍රනාන්දු මහත්මිය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිලබලයෙන්)
5. ඒරානන්ද හෙට්ටිආරච්චි මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිලබලයෙන්)
6. ආචාර්ය කීර්ති බණ්ඩාර කොටගම - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
7. පී. වී. පී. දයාරත්න මහත්මිය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
8. බෙනට් රත්නායක මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
9. නිරෝමි සනෝජා බිබිලේ මහත්මිය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
10. බී. එම්. ඩී. එන්. බාලසූරිය මහත්මිය - භාණ්ඩාගාර නියෝජිතවරිය
11. නීතිඥ ඩබ්ලිව්. කේ. වික්‍රමආරච්චි මහත්මිය- සහකාර සාමාන්‍යාධිකාරී - නීති / අධ්‍යක්ෂ මණ්ඩල - ලේකම්

අංක 2 : 2018.06.06 සිට 2018.10.31 දක්වා

1. සිතේන්ද්‍ර සේනාරත්න මහතා - සභාපති
2. නීතිඥ නිලන්ත කුමාරගේ මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ
3. නීතිඥ සුදර්ශන ගුණවර්ධන මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිලබලයෙන්)
4. අනුෂා ගෝකුල ප්‍රනාන්දු මහත්මිය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිලබලයෙන්)
5. ඒරානන්ද හෙට්ටිආරච්චි මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිලබලයෙන්)
6. නීතිඥ අනිල් රාජකරුණා මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
7. පී. වී. පී. දයාරත්න මහත්මිය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
8. බෙනට් රත්නායක මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
9. නිරෝමි සනෝජා බිබිලේ මහත්මිය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
10. බී. එම්. ඩී. එන්. බාලසූරිය මහත්මිය - භාණ්ඩාගාර නියෝජිතවරිය
11. නීතිඥ ඩබ්ලිව්. කේ. වික්‍රමආරච්චි මහත්මිය- සහකාර සාමාන්‍යාධිකාරී - නීති / අධ්‍යක්ෂ මණ්ඩල - ලේකම්

අංක 3 : 2018.11.01 සිට 2018.11.08 දක්වා

1. සනත් වීරසූරිය මහතා - සභාපති

අංක 4 : 2018.06.06 සිට 2018.10.31 දක්වා

1. ජගත් මංජුල යාපා මහතා - සභාපති
2. සැම්සන් කුමාරගේ මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ
3. නාලක කළුවැව මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික(නිලබලයෙන්)
4. අනුෂා ගෝකුල ප්‍රනාන්දු මහත්මිය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිලබලයෙන්)
5. ඒරානන්ද හෙට්ටිආරච්චි මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිලබලයෙන්)
6. නීතිඥසමන් විරමන් මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
7. නදීකා ගුණසේකර මහත්මිය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
8. ආචාර්ය ටියුඩර් වීරසිංහ - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
9. මහාචාර්ය සේනා නානායක්කාර - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
10. බී. එම්. ඩී. එන්. බාලසූරිය මහත්මිය - භාණ්ඩාගාර නියෝජිතවරිය
11. නීතිඥ ඩබ්ලිව්. කේ. වික්‍රමආරච්චි මහත්මිය - සහකාර සාමාන්‍යාධිකාරී - නීති / අධ්‍යක්ෂ මණ්ඩල - ලේකම්

03.දේශීය චිත්‍රපට නිෂ්පාදනය

	විස්තරය	ප්‍රගතිය (රු. ශත)	
3.1	**<u>දේශීය චිත්‍රපට නිෂ්පාදන ලියාපදිංචි කිරීම :</u>** චිත්‍රපට සංඛ්‍යාව 64 (එක් චිත්‍රපටයක් වෙනුවෙන් රු. 3000/- ක මුදලක් ලියාපදිංචි ගාස්තු වශයෙන් අයකරනු ලැබේ.)		192,000.00
3.2	**<u>චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ සංස්ථා භාරය</u>** විශ්‍රාම වැටුප් ගෙවීම්: එක් අයෙකුට රු. 2,000 බැගින් ජනවාරි - අප්‍රේල් දක්වා I. ජනවාරි - පෙබරවාරි දක්වා (54 දෙනෙකු සඳහා) II. මාර්තු - අප්‍රේල් දක්නා (53 දෙනෙකු සඳහා) **<u>එක් අයෙකුට රු. 5,000/- බැගින්:</u>** ඉහත විශ්‍රාම වැටුප් ගෙවීම් සිදුකරන ලද 53 දෙනාට අමතරව, නව විශ්‍රාම වැටුප් ලාභීන් 79 දෙනෙකු 2018 මැයි මස සිට මෙම ගෙවීම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදි. III. මැයි - ජූනි (131 දෙනෙකු සඳහා) IV. ජූලි - අගෝස්තු (129 දෙනෙකු සඳහා) V. සැප් - නොවැම්බර් (129 දෙනෙකු සඳහා) VI. දෙසැම්බර් (128 දෙනෙකු සඳහා)	216,000.00 212,000.00 1,310,000.00 1,290,000.00 1,935,000.00 645,000.00	5,608,000.00
3.3	**සුවිශේෂී කලාකරුවන් වෙනුවෙන්** • වෛද්‍යාධාර ගෙවීම් : I. තිලක් ජයවීර මහතා II. සිරි කහවර මහතා III. එම්. වී. හේමපාල මහතා IV. ලතා වල්පොල මහත්මිය V. දමයන්ති ෆොන්සේකා මහත්මිය VI. මැල්කම් මන්නාර මහතා VII. විල්සන් කරුණාරත්න මහතා VIII. ජී. ආර්. පෙරේරා මහත්මිය IX. දයා විමලවීර මහතා X. වී. වාමදේවන් මහතා (එක් අයෙකුට රු. 50,000/- බැගින් ගෙවීම්) • මරණාධාර ගෙවීම් I. රෝයි ද සිල්වා මහතා • ඇගයීම් I රෙක්ස් කොඩිප්පිලි මහතා		550,000.00 250,000.00 50,000.00

3.4	**චිත්‍රපට ආනයනය :** 2018 වර්ෂය සඳහා චිත්‍රපට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම වෙනුවෙන් අයදුම්පත් 20ක් නිකුත් කිරීම. (එක් අයදුම්පතක් වෙනුවෙන් රු. 25,000.00 බැගින්) ඒ අනුව 2018 වර්ෂය සඳහා විදේශ චිත්‍රපට ආනයනය වෙනුවෙන් සුදුසුකම් ලාභී දේශීය සැපයුම්කරුවන් 18කු ලියාපදිංචි කිරීමට කටයුතු කරන ලදි. මෙම වර්ෂය තුල ආනයනය කරන ලද (දමිළ/ හින්දි/ ඉංග්‍රීසි) භාෂාමය චිත්‍රපට සංඛ්‍යාව 171 කි. දමිළ චිත්‍රපට - 76 ඉංග්‍රීසි චිත්‍රපට -65 හින්දි චිත්‍රපට - 30 (එක් චිත්‍රපටයක් ආනයනය කිරීම වෙනුවෙන් රු. 5,000/- ක මුදලක් අයකරනු ලැබේ.)		500,000.00 855,000.00
3.5	විදේශ රැගත කිරීම සඳහා අනුමැතිය ලබාදීම. වෘතාන්ත චිත්‍රපට - 11 වෙළඳ වැඩසටහන් - 08 වාර්තා වැඩසටහන් - 51	1,215,000.00 400,000.00 1,375,000.00	2,990,000.00
3.6	දේශීය චිත්‍රපට සඳහා දායක වූ විදේශ රංගන හා කාර්මික ශිල්පීන් වෙනුවෙන් අයකිරීම් • යසෝධරා චිත්‍රපටයේ ප්‍රධාන රංගන ශිල්පීන් 02 සඳහා		500,000.00
3.7	**<u>වෙනත් (විශේෂ සේවා)</u>** I සිනමා ශිල්පී සහ පැරණි චිත්‍රපට සඳහා අන්‍යතාවය සහතික කිරීමේ ලිපි නිකුත් කිරීම. IIශ්‍රී ලංකා රේගුව වෙත රේගු නිෂ්කාශන ලිපි නිකුත් කිරීම. IIIදේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත සිනමාශාලා වෙනුවෙන් බදු සහන ලබාදීම සඳහා තහවුරු ලිපි නිකුත් කිරීම. Iv මෙරට රූගත කරනු ලබන දේශීය හා විදේශීය චිත්‍රපට සහ අනෙකුත් වැඩසටහන් සඳහා විදේශයන් වෙනිත් ආනයනය කරනු ලබන කැමරා ඇතුළු තාක්ෂණික මෙවලම් සඳහා ශ්‍රී ලංකා රේගුව වෙත ඇපකරයක් ලබාගැනීමෙන් අනතුරුව රේගු නිෂ්කාශන ලිපි නිකුත් කිරීම. V සිනමාශිල්පීන්ගේ සුභසාධන කටයුතු සඳහා සහය ලබාදීම. සිනමා හා කාර්මික ශිල්පීන් 55 සඳහා 2018 වර්ෂයේ කලාකරුවන් වෙනුවෙන් හැදුනුම්පත් නිකුත් කිරීම. VI සිනමාව අධ්‍යනය කරනු ලබන විශ්ව විද්‍යාල විද්‍යාර්ථයන් වෙත සිනමා තොරතුරු ලබාදීම සහ දේශන පැවැත්වීම. VII චිත්‍රපට නිෂ්පාදනය සහ චිත්‍රපට ආනයනය වෙනුවෙන් අධිකරණ කටයුතු සඳහා ජාතික චිත්‍රපට සංස්ථාව වෙනුවෙන් අවශ්‍ය තොරතුරු සමග ඉදිරිපත් කිරීම. VIII සංස්ථා (රිද්මා) මණ්ඩලය යටතේ ප්‍රදර්ශනය සඳහා මුදා හරිනු ලබන දේශීය සහ විදේශීය චිත්‍රපට වෙනුවෙන් බෙදාහැරීමේ ගිවිසුම් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.		

04. පිරිස් හා ආයතන පාලනය

4.1

කාර්ය මණ්ඩලය	
2018.01.01 වන දිනට සේවක සංඛ්‍යාව	
අනුමත සංඛ්‍යාව	186
ස්ථීර සංඛ්‍යාව	120
වෙනත් සංඛ්‍යාව	09
විශ්‍රාම ලැබූ සංඛ්‍යාව	04
(වර්ෂය තුළ බදවාගත් සේවක සංඛ්‍ය 2018	13
වර්ෂය තුල ඉවත් වූ සංඛ්‍යා 2018	
විශ්‍රාම ලැබූ සේවක සංඛ්‍යාව	04
සේවයෙන් ඉල්ලා අස්වූ සේවක සංඛ්‍යාව	02
2018 වර්ෂය තුළ ස්ථීර කාර්ය මණ්ඩලය	116 (100-6)
අනෙකුත් කාර්ය මණ්ඩලය	
සභාපති	01
ක්‍රියාකාරී අධ්‍යක්ෂ	01
දෛනික දීමනා	01
කොන්ත්‍රාත්	01
රාජකාරි ඉටුකිරීම	01
පුහුණු	12
2018.12.31 දිනට මුළු සේවකයින්	132

4.2 ආයතන පාලනය හා සේවක අවශ්‍යතා ඉටුකිරීම

ආයතනයේ සේවක පාලනයට අදාලව අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග ඉදිරියට ගෙනයමින් සේවා කටයුතු ඉටුකර ඇත.

05. චිත්‍රපට ප්‍රචාරණය/ සිනේ ඇඩ්

5.1 වසර තුළ ඉටුකල කාර්යයන්

1. දේශීය සිනමාවේ 71 වන සැමරුම හා ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව ආරම්භ කර වසර 46 සපිරීම වෙනුවෙන් පැවති උත්සවය 2018.01.21 වන දින සංස්ථාවේ දී පැවැත්විය. එහිදී 2017 වර්ෂයේදී පිළිගත් චිත්‍රපට උළෙල නියෝජනය කර සම්මාන ලබාගත් සිනමා ශිල්පීන් ඇගයීමට ලක් විය.

    - චිත්‍රපට අධ්‍යක්ෂ - සෝමරත්න දිසානායක මහතා
    - චිත්‍රපට අධ්‍යක්ෂ - සංජීව පුෂ්පකුමාර මහතා
    - චිත්‍රපට අධ්‍යක්ෂ - අශෝක හදගම මහතා
    - චිත්‍රපට අධ්‍යක්ෂ - විසාකේස චන්ද්‍රසේකරම් මහතා
    - චිත්‍රපට අධ්‍යක්ෂ - බෙනට් රත්නායක මහතා
    - රංගන ශිල්පිනි - අනෝමා ජිනාදරි මිය
    - රංගන ශිල්පි - දසුන් පතිරණ මහතා
    - රංගන ශිල්පි - ජෙහාන් අප්පුහාමි මහතා
    - රංගන ශිල්පි - භූමි හරේන්ද්‍රන්
    - කැමරා අධ්‍යක්ෂ - විශ්වජීත් කරුණාරත්න මහතා

2. ප්‍රවීණ චිත්‍රපට අධ්‍යක්ෂ සුමිත්‍රා පිරිස් මහත්මියගේ 83 වන උපන්දිනය 2018.03.24 දින සැමරීම.

3. ප්‍රවීණ චිත්‍රපට අධ්‍යක්ෂ ලෙස්ටර් ජේමිස් පීරිස් මහතාගේ 99 වන උපන්දිනය 2018.04.05 දින එම නිවසේදී සැමරීම.

4. අචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතාගේ අභාවය වෙනුවෙන් සංස්ථා දායතක්වය ලබාදීම.

5. 2018.08.31 දින කොළඹ 07 චිත්‍රපට සංස්ථා සිනමාශාලාවේදී පැවති රෝයි ද සිල්වා උපහාර උළලේ මාධ්‍ය ප්‍රචාරක කටයුතු.

6. ප්‍රදර්ශනය වන චිත්‍රපට පිළිබඳ ප්‍රේක්ෂකයා දැනුවත් කිරීම වෙනුවෙන් මාධ්‍යවේදීන්, මාධ්‍ය ආයතන චිත්‍රපට විචාරකයින් සඳහා නිදහස් නැරඹීමේ අවසර පත්‍රයක් ලබාදීම. (වසරින් වසර අලුත්වන පරිදි)

06. අධ්‍යාපන, ප්‍රවර්ධන හා සංස්කෘතික අංශය

"ජීවිතයට සිනමාව" සිනමා රසවින්දන වැඩසටහන

	දිනය	වැඩසටහන	ස්ථානය
1	2018.03.20	සිනමා රසවින්දන වැඩමුළුව	බිබිල ජාතික පාසල
2	2018.03.21	”	මැදගම ජාතික පාසල
3	2018.03.29 2018.04.02	”	යොවුන්පුරය - නිකවැරටිය ගොවිපල පිටිය
4	2018.07.26	”	වයඹ ජාතික අධ්‍යාපන පීඨය
5	2018.09.21	”	පරිවාස හා ළමාරක්ෂන සේවා දෙපාර්තමේන්තුව - ඇඹිලිපිටිය
6	2018.09.27	”	ඕකේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
7	2018.10.15	”	වලස්මුල්ල ජාතික පාසල

අධ්‍යාපනික චිත්‍රපට ප්‍රදර්ශන වැඩසටහන්

	දිනය	වැඩසටහන	ස්ථානය
1	2018.03.07/08	චිත්‍රපට ප්‍රදර්ශන	සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය
2	2018.06.16	”	අවුලේගම බයව රජමහ විහාරය - කුරුණෑගල
3	2018.06.28	”	දොඩන්ගොඩ
4	2018.07.14	”	දංකොටුව
5	2018.07.31	”	රත්නාවලි බාලික විද්‍යාලය - ගම්පහ
6	2018.10.06	”	මාකොළ දකුණ
7	2018.10.10,11,12	”	ගාල්ල මහින්ද විද්‍යාලය
8	2018.11.02,03,04	”	වලස්මුල්ල ජාතික පාසල

සිනමා කතිකාව

	දිනය	වැඩසටහන	ස්ථානය
1	2018.02.15	සුළං කිරිල්ලි චිත්‍රපටය	සංස්ථා සිනමා ශාලාව සම්පත් දායකත්වය - භූපති නලින් මහතා

සිනමාකරණ ඩිප්ලෝමා පාඨමාලාව 2018

පාඨමාලාවේ පළමු අදියර සාර්ථකව අවසන් කර ඇත. දෙවන අදියර ආරම්භ කර ඇත. සිසුන් 40.

2018 වර්ෂයේ "චිත්‍රපට" සඟරාව ප්‍රකාශයට පත්කිරීම

1. චිත්‍රපට සඟරාව ජනවාරි - මාර්තු කලාපය
2. චිත්‍රපට සඟරාව දෙවන කලාපය
3. චිත්‍රපට සඟරාව තෙවන කලාපය

2018 වර්ෂයේ සංස්ථා ප්‍රකාශන නිකුත් කිරීම

දේශීය චිත්‍රපට නාමාවලිය ග්‍රන්ථය නිකුත් කර ඇත.

07. බෙදාහැරීම් හා ගබඩා

- චිත්‍රපට සංස්ථාවේ අවසරය මත ආනයනය කරනු ලබන දේශීය හා විදේශීයව නිෂ්පාදනය කරනු ලබන චිත්‍රපට භාරගෙන ලේඛනගත කිරීමට කටයුතු කිරීම.

- එම චිත්‍රපට භාරගෙන තත්ත්ව පරීක්ෂා කර රැගුම්පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම, තත්ත්ව වාර්තා ලබාගැනීම තුළින් සංස්ථාවට ආදායමක් ලැබීමට සැලැස්වීම, රැගුම්පාලක මණ්ඩලයේ අනුමැතිය පරිදි නැවත තත්ත්ව වාර්තා ලබාගෙන ආනයනකරු/ නිෂ්පාදක බෙදාහැරීම් මණ්ඩලයට භාරදීම හෝ සිනමාශාලා වෙත බෙදාහැරීම.

- සංස්ථා මණ්ඩලය මගින් අනුපෙළ ගන්වනු ලබන චිත්‍රපට නියමිත සිනමාශාලා වෙත දුම්රියෙන් සහ අතින් යැවීම හා නිසි පරිදි ගෙන්වා ගැනීම.

- එම චිත්‍රපට වලට අදාල පූර්ව ප්‍රචාරක ද්‍රව්‍ය සිනමාශාලා වෙත කල්වේලා ඇතිව යැවීම.

- චිත්‍රපට ගබඩාව වෙත ලැබෙන සියලුම චිත්‍රපට නැවත පරීක්ෂා කොට රාක්ක ගත කිරීම.

- රාක්කගත කර ඇති චිත්‍රපට වරින්වර පරීක්ෂා කිරීම.

- තත්ත්ව පරීක්ෂා කිරීමට ලබාගැනීම නිසා උපයා ඇති ආදායම රු. මි. 100,8 ක් පමණ වේ.

- චිත්‍රපට ගබඩාවේ ඇති පැරණි චිත්‍රපට ප්‍රතිසංස්කරණය කර නැවත ප්‍රදර්ශනයට සුදුසු ආකාරයෙන් සකස් කිරීම හා ඒ තුළින් ආදායමක් ඉපයීම.

- චිත්‍රපට ගබඩාවේ තැන්පත් කර ඇති දේශීය හා විදේශීය චිත්‍රපට පිළිබඳ තොග සංගණනයක් සිදුකිරීම.

- ❖ පැරණි චිත්‍රපට වලින් ධාවනයට සුදුසු චිත්‍රපට පිටපත් පමණක් චිත්‍රපට ගබඩාවේ රඳවා ඉතිරි වන සියලුම චිත්‍රපට අයිතිකරුවන් වෙත භාරදීම මගින් චිත්‍රපට ගබඩාවේ නඩත්තු කටයුතු ක්‍රමවත්ව සිදුකිරීම.

- ❖ චිත්‍රපට ගබඩාවේ තැන්පත් කර තිබූ විදේශීය චිත්‍රපට පිටපත් දළුගම - සරසවි චිත්‍රාගාරයේ සංරක්ෂණාගාරය වෙත යොමු කිරීම.

- ❖ සිංහල, දෙමළ, ඉංග්‍රීසි හා හින්දි චිත්‍රපට 18ක් ලියාපදිංචි කර ඇත.

- ❖ අධිලේඛනාගාරයේ තැන්පත් කර ඇති සිංහල චිත්‍රපට තත්ත්ව පරීක්ෂා කිරීමට කටයුතු කිරීම.

08. නීති අංශය

සංස්ථාව පාර්ශවයක් වන නඩු සම්බන්ධයෙන් සංස්ථාව වෙනුවෙන් පෙරකලාසි ගොනු කිරීම හා ඊට අදාල අධිකරණයේ සංස්ථාව වෙනුවෙන් පෙනී සිටීම.

කම්කරු දෙපාර්තමේන්තුව ඉදිරියේ කාර්මික ආරවුල් සඳහා සංස්ථාව වෙනුවෙන් පෙනී සිටීම.

දේශීය චිත්‍රපට නිශ්පාදනය, ආනයනය කරනු ලබන චිත්‍රපට, බෙදාහැරීම සහ චිත්‍රාගාර සේවා / පිටපත් මුද්‍රණය/ උප ශීර්ෂපාඨ පාඨ යෙදීම/ ප්‍රචාරක කටයුතු සඳහා ණය මුදල් ලබා දීම සහ සේවා සැපයීම ඇතුළු සියලුම නීත්‍යානුකූල ගිවිසුම් සකස් කිරීම සහ සම්පූර්ණ කරන ලද ගිවිසුම් පිටපත් අදාල අංශ වෙතට යොමු කිරීම.

ජාතික චිත්‍රපට සංස්ථාවට උපකාරක සේවා ලබා ගැනීම සහ වෙනත් කටයුතු සම්බන්ධයෙන් සියලුම නීත්‍යානුකූල ගිවිසුම් සකස් කිරීම සහ අත්සන් තැබීම.

එදිනෙදා අවශ්‍යතාවය පරිදි සංස්ථාවේ ඕනෑම අංශයකින් යොමු කරන නීතිමය ගැටලු සඳහා උපදෙස් ලබා දීම.

2018 වර්ෂය තුළ ක්‍රියාත්මක නඩු පිළිබඳ විස්තර

1. ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක :HCCA/LA 181/2016 (2018/10/04 අවසන් වන ලදි)
2. අභියාචනාධිකරණ නඩු අංක : 870/99
3. HC/civil/35/18/IP ධවලචිජත්‍රය චිත්‍රපටය සම්බන්ධ නඩුව (2018/12/13 නඩුව කැඳවන ලදි)
4. මහාධිකරණ නඩු අංක :HC ALT 21/2017 } 2018/09/06 දින දක්වා
5. මහාධිකරණ නඩු අංක :HC ALT 22/2017
6. දිසා අධිකරණ නඩු අංක DMR 1126/2012 - සිනේසිටි සිනමාශාලා 4න් සංස්ථාවට අයවිය යුතු සංස්ථා භාරය නොගෙවීම සම්බන්ධයෙන් සංස්ථාව විසින් නඩු පවරන ලදි.
7. කම්කරු විනිශ්චය සභා නඩු අංක : 13/41/2013
8. DMR 2603/2013 වලාපටල - චිත්‍රපටය
9. CHC 370/2014 - සුභා චිත්‍රපටය
10. කොළඹ දිසා අධිකරණ නඩු අංක DSP 140/2015
11. DSP 99/2018 චිත්‍රපට ෙබදාහැරීම සංස්ථාවට පවරාගැනීමට එරෙහිව මණ්ඩල විසින් ගොණුකර ඇති නඩුව
12. DSP 131/18 මුවී වර්කස් පුද්ගලික සමාගම විසින් පවරා ඇති නඩුව
13. D.S.P 00166/17 කාල චිත්‍රපටය
14. මාතර D.C ප්‍රෝ/318 නිව් සිනමා - මාතර
15. කම්කරු දෙපාර්තමේන්තුවේ පැවති පරීක්ෂණ

    I. කම්කරු කාර්යාල පැමිණිලි අංකය :IR/15/19/2012- සංස්ථා සේවක සමිත දිසානායක මහතා

    II. කම්කරු කාර්යාල පැමිණිලි IR 253/2016 ඩී. ආර්. ඒස්. රංජනි පෙරේරා මහත්මිය

    III. කම්කරු කාර්යාල පැමිණිලි අංක CC/C/IR/135/2015 එම්. ඒ. ඩබ්. කුමාරසිරි ඇතුලු සේවක පිරිස

    IV. කම්කරු කාර්යාල පැමිණිලි CC/C/WB/512/2018 ජී. එස්. තිලකරත්න මහතා

09. මූල්‍ය

01. ආදායම් ප්‍රභවයන්

2017 - 2018 යන වර්ෂයන්හි සත්‍ය ආදායම හා 2018 වර්ෂයේ අයවැයගත ආදායමපිළිබඳ තොරතුරු පහත දැක්වේ.

ආදායම	2017 සත්‍ය රු.මි.	2018 සත්‍ය රු.මි.	අඩුවීම වැඩි / වීම %	2018 අයවැය රු.මි.
බෙදාහැරීමේ කොමිස් දේශීය -	17.9	12.9	(28.0)	35
විදේශීය	12.2	11.7	(4.1)	
වැඩිවීම (සංස්ථාභාරය)	8.7	8.5	(2.3)	9
අධිභාර පරීකෂණ දඩ මුදල් හා වෙනත්	6.4	5.6	(12.5)	5.6
සිනේඇඩිස් කොමිස්	0.3	0.8	166	0.4
චිත්‍රාගාරයේ ආදායම	2.2	1.3	(41.0)	3.2
වෙළඳ කටයුතු	2.3	2.2	(4.3)	3.8
මෙහෙයුම් ආදායම්	**50**	**43**	(14)	**57**
වෙනත් ආදායම්	**66.5**	**72.7**	9.3	**47**
භාණ්ඩාගාරයෙන් ජනාධිපති සම්මාන උළෙල සඳහා-	**-**	**-**	-	
පුනරාවර්තන වියදම් සඳහා ලැබීම්	**81**	**63.8**	(21.2)	**100**
මුළු ලැබීම්	**197.5**	**179.5**	(9.1)	**204**

2017ට සාපේක්ෂව සලකා බැලීමේදී මෙහෙයුම් ආදායම 2018දී 2017ට වඩා14% ක අඩුවීමක්පෙන්වා ඇත. මෙයට හේතුව බෙදාහැරීමේ කොමිස් 32.1% කින්ද, සංස්ථා භාරය 2.3% කින්ද, අධිභාර හා පරීක්ෂණ දඩ මුදල් 12.5% කින් ද,චිත්‍රාගාරයේ ආදායම 41% කින්ද, වෙළඳ කටයුතු 4.3%ආදායම් පහල යාම.

සිනේ ඇඩිස් ආදායම 166%වැඩි වීමක් පෙන්වාඇත.

02. <u>වියදම් ප්‍රභවය</u>

2017,2018 යන වර්ෂයන්හි සත්‍ය වියදම සහ 2018 වර්ෂයේ අයවැයගත වියදමපිළිබඳ තොරතුරු පහත දැක්වේ.

වියදම	2017 සත්‍ය රු.මි.	2018 සත්‍ය රු.මි.	අඩුවීම / වැඩි වීම %	2018 අයවැය රු.මි.
සේවක පාරිශ්‍රමික	80.6	80.6	-	80
ගමන් හා යැපීම් දීමනා	1.4	1.4	-	1.8
සැපයුම් හා උපකරණ	7.5	7.2	(4.0)	9.7
අළුත්වැඩියා කිරීම් හා නඩත්තු ක්ෂයවීම්	29.4	32.9	11.9	28.8
ජාතික චිත්‍රපට උත්සව	-	-	-	41
විකුණුම් පිරිවැය	3.2	1.8	(43.8)	2.5
ප්‍රවාහන සම්බන්ධතා,අවශ්‍යතා වෙනත්	24.7	24.5	(0.81)	27
බොල් ණය වෙන් කිරීම්	14.7	22.2	50.0	0.5
පාරිතෝෂික වෙන් කිරීම	6.6	7.1	7.6	6.6
චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල	0.5	0.5	-	0.5
මුළු වියදම	168.6	178.2	5.7	198.4

2017වර්ෂයට සාපේක්ෂව බොල් ණය වෙන් කිරීම 50% කින් ද, පාරිතෝෂික වෙන් කිරීම 7.6% කින් ද, අළුත්වැඩියා කිරීම් හා නඩත්තු ක්ෂය විම් 11.9% කින් ද වැඩි වීම සමස්ත වියදම වැඩිවීමට බලපා ඇත.

-

	2017 රු.මි.	2018 රු.මි.	%
මෙහෙයුම් ආදායම	50.1	43.0	(14.2)
අඩුකළා			
මෙහෙයුම් වියදම	168.6	178.2	5.7
මෙහෙයුම් ලාභය / අලාභය	(118.5)	(135.2)	14.1
එකතුකළා			
වෙනත් ආදායම්	66.5	72.7	(9.3)
වර්ෂයේ ලාභය / අලාභය	(52.0)	(62.5)	20.2
එකතුකළා			
භාණ්ඩාගාරයෙන් -			
පුනරාවර්ථන වියදම් සඳහා ලැබීම	81.0	63.9	(21.1)
අතිරික්තය	29.0	1.4	(95.1)

2017ටසාපේක්ෂව 2018වර්ෂයේදී මෙහෙයුම් අලාභය 14.1%කින් වැඩි වී වෙනත් ආදායම9.3% කින් වැඩි වී ඇත.2017වර්ෂයට සාපේක්ෂව 2018වර්ෂයේ අලාභය 20.2% කින් වැඩි වී ඇත.
පුනරාවර්තන ලැබීම් ගැලපීමෙන් පසු 2017 වර්ෂයට වඩා 2018 වර්ෂයේ 95.1% කින් අතිරික්ත අඩු වී ඇත. මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේ2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේදී මෙහෙයුම් වියදම 5.7% වැඩි වීම හා 2017 ට වඩා මෙහෙයුම් ආදායම් 14.2% අඩු වීමයි.

03. ස්ථාවරවත්කම්

2018 වර්ෂයේ වාහන ප්‍රත්‍යාගණනය කර ඇති වටිනාකම රු. මිලියන 10.8 ක් ද, සිනමා සංකීර්ණය සඳහා ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් ලබාගැනීමට රු. මිලියන 25.7ක් වේ.

04. ජංගම වත්කම්

පසුගිය වර්ෂයට සාපේක්ෂව සලකා බලනවිට ජංගම වත්කම් රු.මි.07කින්අඩු වී ඇත. එසේ වුවද ණයගැති ශේෂයෙන් අයකර ගත නොහැකි පැරණි ණය, බොල්ණය වශයෙන් අඩුකර පෙන්වා ඇති අතර ණයගැති ශේෂ රු.මිලියන 25 කින් වැඩි වී ඇත. මුදල් හා බැංකු ශේෂය රු. මිලියන 56කින් අඩුවී ඇත.

05. ජංගම වගකීම්

චිත්‍රපට කුලි ණයහිමියන් පසුගිය වර්ෂය සමග සැසඳීමේදි රු.මි.5.8කින් අඩු වී ඇත.වෙනත් ණයහිමියන් මිලියන 40 කින් වැඩි වී ඇත.

10. චිත්‍රාගාර සේවාවන් සැපයීම

ශබ්ද අංශයෙන් සේවා සැපයූ චිත්‍රපට

	චිත්‍රපටය
1	තක්කිට තරිකිට
2	විෂම භාග
3	ෆ්‍රෝසන් හාට්
4	නව දෙමෝදර පාලම
5	රීලෝර්ඩ්
6	කවි බණ
7	රන් කොල්ලා
8	ශ්‍රී වික්‍රම
9	ඉක්කා
10	රෙඩ් මස්ටැන්ග්
11	එළ ඩබල
12	බිම්බා දේවි හෙවත් යශෝදරා
13	1970 ලව් ස්ටෝරි
14	ජුදාස්ගේ හෘද සාක්ෂිය
15	රෂ්
16	Bullet Proof Children
17	මායා රාත්‍රිය
18	ආයු

සංස්කරණ අංශයෙන් සේවා සැපයූ චිත්‍රපට

අනු අංකය	චිත්‍රපටය
1	සීතල යුද්ධය
2	මායා රාත්‍රිය
3	ජාතික චිත්‍රපට සංස්ථා 71 වන සංවත්සරයට අදාල වාර්තා වැඩසටහන
4	ඔලුව ජපන් කළ ජර්මන්
5	වීර කුමාරි

රූගත කිරීමේ මැදිරිය සහ චිත්‍රාගාරය පරිශ්‍රය භාවිතය

	චිත්‍රපටය/වැඩසටහන්	ආයතනය
1	සිංහගිරි ස්ටුඩියෝ සංගීත වැඩසටහන	දෙරණ රූපවාහිනී නාලිකාව
2	පියෝ ලෙජන්ඩ් සංගීත වැඩසටහන	ජාතික රූපවාහිනී නාලිකාව
3	ජාතික චිත්‍රපට සංස්ථා 71 වන සංවත්සරයට අදාල වාර්තා වැඩසටහන	
4	අල්ලපු ගෙදර චිත්‍රපටයේ දර්ශන රූගත කිරීම	අනුපමා ෆිල්ම්ස්
5	දැස මානේ - ධනංජය සිරිවර්ධන මහතාගේ ගීතයක්	
6	ජය පිට ජය - විනෝදාත්මක තරඟය	හිරු රූපවාහිනී නාලිකාව
7	දෙරණ ලිට්ල් ස්ටාර් සීසන් 09 වැඩසටහන රූගත කිරීම්	දෙරණ රූපවාහිනී නාලිකාව
8	කාන්තා දින වැඩසටහන	වයඹ සංවර්ධන බැංකුව
9	දෙරණ සිඟිති අවුරුදු කුමරා කුමරිය වැඩසටහන	දෙරණ රූපවාහිනී නාලිකාව
10	කොටස් වෙළඳපොළ - ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන	
11	ඩැඩී බෑන්ඩ් සංගීත කණ්ඩායම	
12	ආදර හීනය චිත්‍රපටය රූගත කිරීම්	ආලංකුලම ෆිල්ම්ස්
13	සෙනෙහස සවිය - පොත දොරට වැඩුම	Social Welfare Foundation
14	රූකඩ පැංචි චිත්‍රපටයේ දර්ශන රූගතකිරීම	පින්සර පික්චර්ස්
15	The Supreme Chef – ඉවුම් පිහුම් වැඩසටහන	Rala Creations
16	දෙරණ සික්ස්ටි ප්ලස් වැඩසටහන රූගත කිරීම්	දෙරණ රූපවාහිනී නාලිකාව
17	පොත් දොරටු වැඩුම	චමින්ද මහතා

BAW ජයමාන්න මැදිරිය සහ ශබ්ද අංශය - අත්කරගත් ප්‍රගතිය

01. වහල සකස් කිරීම, පිහිලි දැමීම සහ බිත්ති Water proof කිරීම.
02. සිවිලිම අලුතින් සකස් කිරීම.
03. Lighting Grid සවි කිරීම.
04. පැති බිත්ති වල කොහු මිශ්‍රිත කොට්ට ගලවා නැවත සකස් කිරීම.
05. භාණ්ඩ එහා මෙහා ගෙන යා හැකි පරිදි ඇතුල්වීමේ දොරටුව වෙනස් කර පුළුල් කිරීම.

06. ජයමාන්න මැදිරියේ ඇතුළත බිම කොන්ක්‍රීට් මැදීම සහ පිටත කොරිඩෝව සම්පූර්ණයෙන් ලැලි අතුරා බිම සකස් කිරීම.
07. ශබ්ද අංශයේ දොර නවීකරණය කිරීම (Sound proof දොර)
08. පාලන මැදිරිය සහ ශබ්ද පටිගත කිරීමේ මැදිරිය කාපට් කිරීම.
09. විජය කුමාරතුංග මැදිරියේ ප්‍රමාණවත් පරිදි විදුලි ආලෝකය සකස් කිරීම, බිම කාපට් කිරීම සහ සිවිලිම අලුත්වැඩියා කිරීම.
10. වායුසමීකරණ පද්ධති සම්පූර්ණයෙන්ම පරීක්ෂා කිරීම.
11. ගොඩනැඟිල්ලේ සියලුම විදුලි ආලෝකය සකස් කිරීම, බිම කාපට් කිරීම සහ සිවිලිම අලුත්වැඩියා කිරීම.
12. වායුසමීකරණ පද්ධති සම්පූර්ණයෙන්ම පරීක්ෂා කර බලා අවශ්‍ය විදුලි සන්නායක සවි කිරීම.
13. ශබ්ද මැදිරිය 5.1 Sound proof ශබ්දාගාරයක් ලෙස සකස් කිරීම.

අනෙකුත් කාර්යයන්

මාර්තු 12 දින සිට 16 දින දක්වා චිත්‍රපට සංරක්ෂණ වැඩමුළුව චිත්‍රාගාරයේ පැවැත්වීම.

මාර්තු 21 දින සරස්වතී පූජාව හා සර්වරාත්‍රික පිරිත් දේශනාව පැවැත්වීම.

මාර්තු 22 දින ලෝක පරිසර දින වැඩසටහන

11. විමර්ශන

11.1 2018 වර්ෂය තුළ විමර්ශන අංශය විසින් ඉටුකරන ලද කාර්යයන්

1. සිනමාශාලා ඉදිකිරීම සඳහා ඉඩම් ගොඩනැගිලි පිළිබඳ තොරතුරු රැස්කිරීම.
2. නව සිනමාශාලා විවෘත කිරීම හා වසා දමා තිබූ සිනමාශාලා නැවත විවෘත කිරීම.
3. සිනමාශාලා පරීක්ෂා කිරීම හා අක්‍රමිකතා සඳහා හරපත්‍ර නිකුත් කිරීම.
4. විදේශ රූගත කිරීම් අධීක්ෂණය.

11.2 සිනමාශාලා ඉදිකිරීම සඳහා ඉඩම් ගොඩනැගිලි පිළිබඳ තොරතුරු රැස්කිරීම.

2018 වර්ෂය තුල සිනමාශාලා ඉදිකිරීම සම්බන්ධ තොරතුරු රැස්කිරීම හා ඉදිවෙමින් පවතින සිනමාශාලා ඉදිවෙමින් පවතින සිනමාශාලා

- ❖ යාපනය දිස්ත්‍රික්කය - කෝපායි නගරයේ සිනමාශාලා සංකීර්ණය
- ❖ මාතලේ නගරයේ යෝජිත සිනමාශාලාව
- ❖ මහනුවර නගරයේ (KCC)යෝජිත සිනමාශාලාව

11.3 නව සිනමාශාලා විවෘත කිරීම හා වසා දමා තිබූ සිනමාශාලා නැවත විවෘත කිරීම.

2018 වසර තුල විවෘත කරන ලද නව සිනමාශාලා

1. ජයසේකර සිනමා - සූරියවැව
2. NIT සිනමා - යටියන්තොට
3. නිව් සන්ධ්‍යා - ගම්පොල
4. සුගන්ධි සිනමා - මඩකලපුව
5. මිලානෝ ඩයමන්ට් - කෑගල්ල
6. සාරු සිනමා - පේදුරුතුඩුව
7. සාළු සිනමා - පේදුරුතුඩුව
8. විජය සිනමා - මඩකලපුව
9. කිඛෙස් සිනමා - මඩකලපුව
10. ඔසාකා ලයිට් - නිට්ටඹුව
11. අරුණ සිනමා - කිරිබත්ගොඩ

11.4 සිනමාශාලා පරීක්ෂා කිරීම

පරීක්ෂණ අංශයේ ප්‍රධාන රාජකාරිය වන්නේ සිනමාශාලා පරික්ෂා කිරීමයි. එනම්,

- 2018 වර්ෂයේ පරීක්ෂන වාර 904

සිනමාශාලා වල සිදුවන අක්‍රමිකතා සඳහා හරපත්‍ර නිකුත් කිරීම.

පරීක්ෂන නිලධාරීන් විසින් සිනමාශාලා පරීක්ෂා කිරීමේදි විවිධ අක්‍රමිකතා හඳුනාගෙන ඇත. ඒ සඳහා වක්‍රලේඛ පරිදි කටයුතු කරමින්

- 2018 වර්ෂය සඳහා රු. 693,240.00 වටිනාකමකින් යුතු හරපත්‍ර 69 ක් නිකුත් කර ඇත. ඉන් රු. 399,800.00 ක මුදලක් අයකරගෙන ඇත. (ලේඛනයේ අමුණා ඇත)
- පෙර වර්ෂවල නිකුත් කල හරපත්‍ර වලින් 2018 වර්ෂයේ අයකරගත් හරපත්‍ර 2ක මුදල් රු. 52,300.00 කි.

සංස්ථාවට ගෙවීමට පැහැර හැර තිබූ සංස්ථාභාරය හා චිත්‍රපට කුලිය අයකර ගැනීම.

- 2018 වර්ෂය තුළ රු. 550,000.00 කි.

11.4 විදේශ රූගත කිරීම් අධීක්ෂනය

විදේශ රටවලින් ශ්‍රී ලංකාවට පැමිණෙන වෙළඳ දැන්වීම්, චිත්‍රපට හා වාර්තාමය වැඩසටහන් රූගත කිරීම් අධීක්ෂණ කටයුතු සිදුකරන ලදි. ඒ අනුව

- 2018 වර්ෂයේ විදේශ රූගත කිරීම් 68 ක් අධීක්ෂණය කර ඇත.

12. සැලසුම්, සංඛ්‍යාලේඛන හා පුහුණු

මෙම අංශයේ ප්‍රමුඛ කාර්යභාරය පහත පරිදි වේ.

- ආයතනික සැලසුම් සකස් කිරීමේ අවශ්‍ය මාර්ගෝපදේශකත්වය සැපයීම.
- සංයුක්ත සැලසුම් සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම හා ප්‍රගතිය අධීක්ෂණය
- වාර්ෂික වාර්තා පිළියෙල කිරීම
- මාසික සහ කාර්තුමය ප්‍රගතිය රේඛීය අමාත්‍යාංශය සහ අදාල ආයතන වෙත ඉදිරිපත් කිරීම.
- කාර්යමණ්ඩල පුහුණු අවශ්‍යතාවන් හඳුනාගැනීම හා වාර්ෂික පුහුණු සැලසුම් සකස් කිරීම.
- සංස්ථාවට අයත් ගැසට් වක්‍රලේඛ හා වෙනත් සංඛ්‍යාත්මක දත්ත ආදිය එක්රැස්කර පරිගණක දත්ත පද්ධතියක් පවත්වා ගැනීම.

13. වෛද්‍ය සහනාධාර ක්‍රමය

සාමාජික මුදල් හා සංස්ථාවෙන් ප්‍රදානය කරනු ලබන මුදල් මත පවත්වාගෙන යනු ලබන වෛද්‍ය සහනාධාර ක්‍රමය මෙම වර්ෂය තුල ද ක්‍රියාත්මක වූ අතර එහි පාලන කමිටුව පහත පරිදි වේ.

- නිමල් අබේවර්ධන මහතා - සාමාන්‍යාධිකාරී (කමිටු සභාපති)
- අසංක ගුණතිලක මහතා - පරිපාලන නිලධාරි - පාලන හා මානව සම්පත් (රා.ආ)
- කේ. ආර්. වින්සන් මහතා - කමිටු සාමාජික
- සුබිත ඉලංගකෝන් මහතා - කමිටු සාමාජික

14. සුභසාධක සංගමය

01. Vision Express Optometry Company Ltd ආයතනය මගින් සංස්ථා සේවක මහත්ම මහත්මීන් සඳහා දෘෂ්ඨී විශේෂඥ සේවාවක් සපයන ලදි.

02. සිලෝන් බිස්කට් සමාගමට අනුබද්ධ Plenty Foods (Pvt) Ltd සමාගමේ නිෂ්පාදන හඳුන්වාදීම.

03. Oshani Textile (Pvt) Ltd සමාගම මගින් සහන මිලට රෙදිපිළි ලබාදීම.

04. කොමර්ෂල් බැංකුව මගින් ණයපත් පිළිබඳ දැනුවත් කිරීම.

05. ජාතික ඉතිරි කිරීමේ බැංකුව - බම්බලපිටිය ශාඛාව මගින් සංස්ථා සේවක මහත්ම/ මහත්මීන්ට සහන ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම. මෙම ණය යෝජනා ක්‍රමයෙන් නිලධාරී මහත්ම/ මහත්මීන්ට විශාල සංඛ්‍යාවකට ණය මුදල් ලබාදීම.

06. Dialog ආයතනය මගින් හදුන්වා දෙනු ලබන TV හා වෙනත් සේවාවන් පිළිබඳව දැනුවත් කිරීමක් කිරීම.

07. දම්රෝ ආයතනය මගින් ගෘහ භාණ්ඩ හා විදුලි උපකරණ පහසු ගෙවීමේ ක්‍රමයට ලබා දීම.

08. Asian Lanka Marketing ආයතනය මගින් ප්‍රවර්ධන වැඩසටහන් මෙහෙයවීම.

09. සාමාජික මහත්ම/ මහත්මීන්ගේ පවුලේ සාමාජික මරණාධාර කිහිපයක් ගෙවීම.

15. බෞද්ධ සංගමය

සංස්ථා සේවක මහත්ම මහත්මීන්ගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් සඳහා අවශ්‍ය පොත් ලබා දීම වසර තුළ මූලිකව සිදුකර ඇති අතර වෙසක් පෙහෝය නිමිත්තෙන් තොරණක් ඉදිකිරීම සහ දන්සැල් පවත්වා ඇත.

16. ක්‍රීඩා සංගමය

කාර්ය මණ්ඩලයේ ක්‍රීඩා කුසලතාවන් වර්ධනය වන අයුරින් වසර තුළදී විවිධ ඉසව් පවත්වා ඇත.

17. වෘත්තීය සමිති

ජාතික සේවක සංගමය, ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය, චිත්‍රපට සංස්ථා සේවක සංගමය මෙම වසර තුළදී ද පාලන අධිකාරිය සමග සහයෝගයෙන් කටයුතු කර ඇත.

18. ස්තූතිය


2018 වසරේ සාර්ථක ප්‍රතිපල ලබාගැනීම සඳහා සංස්ථා කාර්යමණ්ඩලය ඉතා වගකීමෙන් හා ධෛර්යයෙන් යුතුව සිය සේවාවන් ඉටුකර ඇත.

එම සේවාවන් අධ්‍යක්ෂ මණ්ඩලය ඉමහත් සේ අගය කරන අතර ඔවුන් වෙත සිය ස්තූතිය කෘතවේදීව පල කර සිටිමි.



ජී. ඒ. කිත්සිරි
සාමාන්‍යාධිකාරී
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව



මූල්‍ය ප්‍රකාශන

2018

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2018.12.31 දිනට අවසන් වර්ෂය සඳහා

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

විස්තරය	සටහන	2018	2017
		රු.	රු.
විකුණුම්	03	43,078,671	50,118,541
අඩු කළා : විකුණුම් පිරිවැය	04	1,804,339	3,173,435
දළ ලාභය		41,274,332	46,945,106
අඩු කළා : වියදම්			
සේවක පාරිශ්‍රමික	05	80,615,418	80,622,539
ගමන් හා යැපීම් දීමනා	06	1,389,174	1,414,583
සැපයුම් හා උපකරණ	07	7,198,155	7,475,827
අවත්වැඩියා කිරීම් නඩත්තු හා ක්ෂයවීම්	08	32,937,729	29,380,892
ප්‍රවාහන , සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා	09	24,480,561	24,672,336
බොල් ණය සඳහා හානිකරන ගැලපීම්	16-A	22,190,423	14,736,803
පාරිතෝෂික වෙන් කිරීම්		7,131,374	6,626,608
චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල් සඳහා වෙන් කිරීම්		500,000	500,000
ජාතික චිත්‍රපට උත්සව සඳහා වෙන් කිරීම			-
		176,442,834	165,429,588
මෙහෙයුම් ලාභය / අලාභය		(135,168,502)	(118,484,482)
එකතු කළා : වෙනත් ආදායම්	10	72,720,747	66,514,077
වසරේ ලාභය /අලාභය		(62,447,755)	(51,970,405)
එකතු කළා : භාණ්ඩාගාර ලැබීම්		63,850,000	81,000,000
බදු පෙර ලාභය		1,402,245	29,029,595
අඩු කළා : බදු සඳහා වෙන් කිරීම්		-	-
ඌනතාවය / අතිරික්තය		**1,402,245**	**29,029,595**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2018 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	සටහන	2018 රු.	2017 රු.
නියෝජනය වන්නේ			
ස්ථාවර වත්කම්			
දේපල , යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	11	339,841,802	339,976,939
දිගු කාලීන ආයෝජන	12	21,588,312	19,689,022
		361,430,114	359,665,961
ජංගම වත්කම්			
කෙටි කාලීන ආයෝජන	13	295,820,920	273,219,772
තොග	14	6,050,330	5,402,684
ණයගැතියෝ	15	127,374,293	117,231,724
විවිධ ණයගැතියෝ	16	190,736,132	175,850,187
තැන්පතු හා ඉදිරි ගෙවීම්	17	3,877,434	3,915,423
මුදල් හා බැංකු ශේෂය	18	35,948,047	90,588,968
		659,807,156	666,208,758
මුළු වත්කම්		**1,021,237,270**	**1,025,874,719**
යෙදවූ ප්‍රාග්ධනය			
අනුදත් ප්‍රාග්ධනය		10,000,000	10,000,000
සමුච්චිත ලාභය		385,259,178	419,196,769
වෙනත් සංචිත		134,282,759	123,482,759
		529,541,937	552,679,528
ජංගම නොවන වගකීම්			
ප්‍රදානයන්	19	104,181,910	124,349,919
පාරිතෝෂික වෙන් කිරීම්	20	43,151,056	40,228,205
		147,332,966	164,578,124
එකතු කළා : ජංගම වගකීම්			
තැන්පතු	21	2,969,499	2,884,227
චිත්‍රපට කුලී ණයහිමියෝ	22	253,098,466	258,933,048
වෙනත් ණයහිමියෝ	23	88,294,402	46,799,792
		344,362,367	308,617,067
මුළු වගකීම්		**1,021,237,270**	**1,025,874,719**

පිටු අංක 05 සිට 21 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 22 සිට 41 දක්වා ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය කොටසකි. මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත අත්සන් කර ඇත

.....
සභාපති

.....
අධ්‍යක්ෂ

වැ.බ.සහකාර සාමාන්‍යාධිකාරී - මුදල් ආදායම්
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව ,
303 , බෞද්ධාලෝක මාවත ,

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	හිමිකම් ප්‍රාග්ධනය	සමුච්චිත ලාභය	ප්‍රාග්ධන සංචිත	ප්‍රත්‍යාගණන සංචිත	වෙනත් සංචිත	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.
2017.01.01 දිනට ශේෂය	10,000,000	390,167,174	499,898	115,153,399	7,829,462	523,649,933
පසුගිය වර්ෂයට ගැලපීම් - සටහන .ඒ		(34,692,207)				(34,692,207)
වසරේ ලාභය	-	29,029,595	-	-	-	29,029,595
පෙර වර්ෂයේ ගැලපීම්		(647,629)				(647,629)
2017.12.31 දිනට ශේෂය	10,000,000	383,856,933	499,898	115,153,399	7,829,462	517,339,692
වසරේ ලාභය	-	1,402,245	-	10,800,000	-	12,202,245
2018.12.31 දිනට ශේෂය	**10,000,000**	**385,259,178**	**499,898**	**125,953,399**	**7,829,462**	**529,541,937**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2018	2017
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල්	රු.	රු.
බදු අඩු කිරීමට පෙර ශුද්ධ ලාභය	(62,447,755)	(51,970,405)
(අඩු කළා)		
නිෂ්පාදන ණය මත පොළිය	(2,163,409)	(859,172)
ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොළිය	(25,428,638)	(26,419,833)
	(90,039,802)	(79,249,410)
මුදල් චලනය කෙරෙහි බල නොපාන විෂයයන් සඳහා ගැලපීම		
ක්ෂයවීම්	25,755,076	23,554,903
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	7,131,374	6,626,608
පාරිතෝෂික අධි වෙන් කිරීම (2017)	-	(102,235)
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගනනය	10,800,000	-
අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන	22,190,423	14,736,803
රාජ්‍ය ප්‍රදානයන් ආදායමට හඳුනා ගැනීම	(20,168,009)	(21,972,624)
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගනයය කිරීමේ ගැලපීම	6	
ස්ථාවර වත්කම් ඉවත් කිරීමේ ලාභය	(50,249)	-
	(44,381,181)	(56,405,955)
ඉකුත් කාල පරිච්ඡේද වල විෂයයන්		
ඉකුත් කාල පරිච්ඡේද වල විෂයයන් සඳහා ගැලපීම	(35,339,836)	742,182
කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය	(79,721,017)	(55,663,773)
කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස්වීම්		
තොගය (වැඩිවීම)	(647,646)	970,648
ණයගැතියෝ (වැඩිවීම)	(47,218,937)	46,553,155
තැන්පතු හා ඉදිරි ගෙවීම් (වැඩිවීම)	37,989	1,256,398
තැන්පතු (වැඩිවීම)	85,272	340,000
ණයහිමියෝ (අඩුවීම)	(5,834,582)	(16,623,752)
වෙනත් ණයහිමියෝ (වැඩිවීම)	41,494,610	(5,014,893)
	(91,804,311)	(28,182,217)
අඩු කළා :		
පාරිතෝෂික ගෙවීම්	(4,208,523)	(2,229,071)
	(96,012,834)	(30,411,288)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
නිෂ්පාදන ණය පොළී	2,163,409	859,172
ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොළිය	25,428,638	26,419,833
ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම	(25,619,946)	(15,027,807)
භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතු ආයෝජනය	(24,500,438)	(8,982,025)
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබූ මුදල්	50,250	-
භාණ්ඩාගාර ලැබීම්	63,850,000	81,000,000
මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශුද්ධ වැඩිවීම්	(54,640,921)	53,857,885
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශේෂය	90,588,968	36,731,083
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශේෂය	**35,948,047**	**90,588,968**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2018 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම පිළිබඳ ප්‍රකාශය

සංස්ථාවේ කළමනාකරණය ,

1. සංස්ථාවේ ආදායම සහ වියදම වත්කම් සහ වගකීම් සහ අනෙකුත් සියළු මූල්‍ය ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තබා ගැනීම පිළිබඳව ,

2. සංස්ථාවේ මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ ඉදිරිපත් කිරීමක් සඳහා , 1995 අංක.15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පනවන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම් සකස් කිරීම පිළිබඳව හා

3. සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීමට හා වංචා සහ විෂමතා වැලැක්වීම සඳහා උචිත පියවර ගැනීම පිළිබඳව වගකිව යුතු වන්නේය.

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2018 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය

---

1. <u>පොදු තොරතුරු</u>

1.1.1 <u>පිහිටීම හා නීතිමය තත්ත්වය</u>

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව 1971 අංක.47 දරන පනත යටතේ ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කොට පිහිටුවන ලදී. එහි ලියාපදිංචි කාර්යාලය , කොළඹ 07 , බෞද්ධාලෝක මාවතේ අංක.303 දරන ස්ථානයෙහි පිහිටියේය.

1.1.2 <u>මූලික ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වරූපය</u>

ශ්‍රී ලාංකේය සිනමාවේ දේශීය අනන්‍යතාව ජාත්‍යන්තරයේ සනිටුහන් කල හැකි ගුණාත්මක සිනමා සංස්කෘතියක් ඇති කිරීමේ පුරෝගාමියා බවට පත්ව සිටී.

1.1.3 <u>නිකුත් කිරීම සඳහා අනුමත කළ දිනය</u>

මෙම මූල්‍ය ප්‍රකාශනයන් බෙදා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019.07.30 දින අනුමැතිය දෙන ලදී.

1.2 <u>ගිණුම් පිළියෙල කිරීමේ පදනම</u>

1.2.1 <u>අනුකූලතාව පිළිබඳ ප්‍රකාශය</u>

සංස්ථාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය , විස්තීර්ණ ආදායම , හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය , වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය සහිත සටහන් (මූල්‍ය ප්‍රකාශන) සකස් කරන ලද්දේ , ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය මඟින් නිකුත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) නියෝජනය වන පරිදි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS) වලට අනුකූල වන පරිද්දෙනි.

1.2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම</u>

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීමේ වගකීම ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ කළමනාකරිත්වය විසින් දරනු ලැබේ.

1.2.3 ගිණුම්කරණ පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් උචිත හෙළිදරව් කිරීමක් කර ඇත්නම් මිස මුල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම් කොට සකස් කර ඇත.

1.2.4 අඛණ්ඩතාව

මුල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී කළමනාකරණය විසින් සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තක්සේරු කර ඇත. සංස්ථාව , එහි මෙහෙයුම් පෙනෙන අනාගත කාලය තුළදී පවත්වාගෙන යාමට අවශ්‍ය තරම් සම්පත් තිබෙන බව විශ්වාසනීයව අපේක්ෂා කරයි. තිබෙන්නා වූ සියලු තොරතුරු සැලකිල්ලට ගත් විට ඉදිරියේදී සංස්ථාව ඈවර කිරීමට හෝ එහි මෙහෙයුම් නතර කිරීමට හේතුවක් නොපෙනෙන අතර , අඛණ්ඩව පවත්නා ආයතනයක් සේ සලකා මුල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

1.2.5 ක්‍රියාත්මක වීමේ හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල්

සංස්ථාවේ ක්‍රියාකාරී ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

1.2.6 වැදගත් වන ගිණුම්කරණ විනිශ්චයන් , ඇස්තමේන්තු සහ උපලේඛන

වාර්තා කරන දිනයේදී වාර්තා කරන ලද ආදායම් , වියදම් , වත්කම් සහ බැරකම් සහ අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීම පිළිබඳව වාර්තා කරන ලද සංඛ්‍යාවන්ට බලපාන විනිශ්චයන් , ඇස්තමේන්තු හා උපකල්පනයන් කිරීමට මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණයට අවශ්‍ය වේ. කෙසේ වුවද , මෙම උපකල්පනයන්ගේ හා ඇස්තමේන්තු වල තිබෙන්නා වූ අවිනිශ්චිතභාවය හේතුවෙන් අනාගතයේදී වත්කම් හා බැරකම් වල පවත්නා වටිනාකම් වල සැලකිය යුතු ගැලපීම් කිරීමට අවශ්‍ය වන්නා වූ බලපෑම් ඇතිවිය හැකිය. මෙම කාරණයන්හි විනිශ්චයන් , ඇස්තමේන්තු හා උපකල්පනයන් ඇතුළත් විය හැකිය.

ඇස්තමේන්තු සහ උපකල්පන

ඉදිරි මූල්‍ය වර්ෂයේදී වත්කම් හා බැරකම් වල පවත්නා වටිනාකම්හි සැලකිය යුතු ගැලපීම් කිරීමට සිදු වන්නා වූ , විශේෂිත අවදානම් ඇතිවිය හැකි , වාර්තා කරන දිනට පැවති අනාගතය පිළිබඳ ප්‍රධාන උපකල්පනයන් හා ඇස්තමේන්තු මූලාශ්‍රයන් පහත දක්වා ඇත.

(අ) මූල්‍ය සාධන පත්‍රයන්හි සාධාරණ අගය

ශේෂ පත්‍රයෙහි වාර්තා කරන ලද මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වල සාධාරණ අගය ක්‍රියාකාරී වෙළෙඳ පොලේ ව්‍යුත්පන්න විය නොහැකි අතර , ඒවා වට්ටම් කළ මූල්‍ය ප්‍රවාහනයන් සහ / හෝ ගණිතමය ආකෘති ඇතුළු ශිල්ප ක්‍රම භාවිතා කරමින් නිශ්චය කර ඇත. මෙම ආකෘති වල යෙදවුම් , හැකි අවස්ථාවන්හිදී නිරීක්ෂණය කළ හැකි වෙළෙඳ පොල දත්තයන්ද එවැනි දෑ නොමැති විට විනිශ්චය කිරීමෙන්ම ලබා ගන්නා ලදී.

මෙම සාධකයන් පිළිබඳ උපකල්පනයන්හි වෙනස්වීම් වාර්තා කර ඇති මූල්‍ය සාධන පත්‍රයන්හි සාධාරණ අගය කෙරෙහි බලපෑ හැකිය.

(ආ) සාධාරණ අගය

සාධාරණ අගය යනු දැනුමක් හා කැමැත්තක් ඇති පාර්ශව අතර අතේ දූරින් සිදු වූ ගණුදෙනුවකදී වත්කමක් හුවමාරු කළ හැකි අගයයි. මූල්‍ය සාධන පත්‍රයක් මුලින්ම හඳුනා ගැනීමේදී එහි සාධාරණ අගය ලෙස සාමාන්‍යයෙන් ගැනෙන්නේ ලැබූ හෝ ගෙවූ වටිනාකමයි. පසුකාලීනව මූල්‍ය වත්කමක සාධාරණ අගය වන්නේ සක්‍රීය වෙළඳපොලක ඉල්ලුම් කෙරෙන ලංසු තබන මිළයි. මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් ඉල්ලුම් කරන මිළයි. මුදල් හා සමාන දෑ සහ කෙටි කාලීන ආයෝජන සඳහා පවත්නා අගය වන්නේ සාධාරණ මිළයි.

2. විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 වත්කම් සහ ඒවා ඇගයීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති මුදල් හා බැංකු ශේෂයන් සහ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේදී හෝ වර්ෂයක් තුළ හෝ යන දෙකින් අඩු කාල සීමාවේදී මුදල් බවට උපලබ්ධි වන ඒවාය.

2.2 මූල්‍ය සාධන පත්‍ර

2.2.1 මූල්‍ය වත්කම් (ව්‍යුත්පන්න නොවන)

මූල්‍ය වත්කම් පහත සඳහන් කොටස් වලට වර්ගීකරණය කෙරේ. ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට අගය කළ දෑ , ණය සහ ලැබිය යුතු දෑ , කල් පිරෙන තුරු හෝ විකිණීමට තිබෙන දෑ , මෙම වර්ගීකරණය කළමනාකරණය විසින් නීර්ණය කරන ලද්දේ මුලික හඳුනා ගැනීම හා එම ආයෝජන අත්පත් කර ගැනීමේ අරමුණ පදනම් කොට ගෙනය.

2.2.2 වර්ගීකරණය , හඳුනා ගැනීම සහ මැනීම.

කළමනාකරණය විසින් එහි මූල්‍ය වත්කම් පහත සඳහන් ලෙස වර්ගීකරණය කරයි.

අ. ණය සහ ලැබිය යුතු දෑ

ආ. විකිණීම සඳහා ඇති දෑ

අ. ණය සහ ලැබිය යුතු දෑ

ස්ථාවර හෝ සක්‍රීය වෙළෙඳපොලේ මිළ ප්‍රකාශ නොවන , තීරණය වූ ගෙවීම් සහිත මූල්‍ය වත්කම්ය. මෙම වත්කම් මුලින්ම සාධාරණ වටිනාකමට එකතු වූ සෘජුවම අදාල වන ගණුදෙනු පිරිවැය හඳුනා ගනු ලැබේ. පසුකාලීනව ණය සහ ලැබිය යුතු දෑ සඵල පොලී ක්‍රමය මත ක්‍රමක්ෂය කිරීමත් , යම් හානිකරණ පාඩුවක් වේනම් එයත් සැලකිල්ලට ගෙන මනිනු ලැබේ.

ආ. විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් යනු නිශ්චිත නොවූ කාල පරිච්ඡේදයක් තබා ගැනීමට අදහස් කරන , ද්‍රවශීලතා හේතු හෝ පොලී අනුපාත වෙනස්වීම මත , විනිමය අනුපාත වෙනස්වීම මත හෝ ස්කන්ධ මිළ මත විකිණීමට අවශ්‍ය විය හැකි හෝ ණය සහ ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කර නොමැති කල් පිරෙන තුරු තබා ගන්නා හෝ ලාභ හෝ අලාභ මත සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම්ය.

2.2.3 සාධාරණ අගය නිශ්චය කිරීම.

ණය සහ අත්තිකාරම් මෙන්ම වගකීම් වල සාධාරණ අගය තීරණය කිරීමේදී වර්තමාන අගය ආකෘතිය එකඟ වූ මුදල් ප්‍රවාහයන් පදනම් කොට ගෙන ණයෙහි ගුණාත්මකභාවයද , ද්‍රවශීලතාව හා පිරිවැයද සැලකිල්ලට ගෙන නිර්ණය කෙරේ. වෙළෙඳ ලැබිය යුතු හා ගෙවිය යුතු අයිතම වල ආසන්න සාධාරණ අගය ලෙස සැලකෙන්නේ පවත්නා වටිනාකමින් හානිකරණය සඳහා අඩු කළ පසු ඉතිරියයි.

2.2.4 ප්‍රති වර්ගීකරණය

ණය හා ලැබිය යුතු දෑහැර මූල්‍ය වත්කම් , වෙලදාම සඳහා අයිතමයන්ගෙන් වෙන් කොට වර්ගීකරණය කිරීමට ඉතා කලාතුරකින් ඇතිවිය හැකි පරිසරයකදී හුදෙකලා සිදුවීමක් ලෙස අවසර දෙනු ලැබේ. ණය සහ ලැබිය යුතු දෑ අතරින් වෙලදාම සඳහා වූ දේ ලෙස ප්‍රති වර්ගීකරණය කිරීම සංස්ථාව විසින් ණය සහ ලැබිය යුතු දෑ යන නිර්වචනයට අදාළ වන්නේනම් ප්‍රතිවර්ගීකරණය තොරා ගනු ඇත.

ප්‍රතිවර්ගීකරණය කරනු ලබන්නේ එසේ කරන දිනට ඇති සාධාරණ අගයටයි. සාධාරණ අගය වන්නේ නව පිරිවැය හෝ ක්‍රමක්ෂය පිරිවැය මතය.

2.2.5 හානිකරණය

(අ) ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගෙන යන මූල්‍ය වත්කම්

එක් එක් වාර්තාකරණ දිනයේදී මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් අගය අඩු වී ඇති බවට වන සාක්ෂි සංස්ථාව විසින් අගය කෙරේ. වත්කමෙහි ආරම්භක හඳුනා ගැනීමෙන් පසු ඇති වූ අවස්ථා එකක හෝ කිහිපයක ප්‍රතිඵලයක් ලෙස (දරන ලද අලාභ අවස්ථා) අගය අඩුවීමක පරමාර්ථ සාක්ෂියක් තිබේනම් සහ එම අලාභ අවස්ථාවට මූල්‍ය වත්කම් වල ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ හෝ විශ්වාසවන්ත ලෙස ඇස්තමේන්තුගත කළ හැකි මූල්‍ය වත්කම් කාණ්ඩයක් මත බලපෑමක් ඇත්නම් පමණක් මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් අගය අඩු වූ බවට සලකනු ලැබේ. අගය අඩුවන බවට වන සාක්ෂි ලෙස , ණයකරුවෙකු හෝ ණයකරුවන් කාණ්ඩයක් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා වලට මුහුණ දෙමින් සිටින බව පෙන්වීම , පොළියෙහි හෝ මූලධන ගෙවීම් වල පැහැර හැරීම් , ඔවුන් බංකොළොත්භාවයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයට පත්වීමට ඇති හැකියාව සහ පැහැර

හැරීම් සමඟ සහසම්බන්ධිත ආර්ථික තත්ත්ව හෝ හිඟ මුදල් වල වෙනස්වීම් වැනි ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ප්‍රවාහ වල ඇඟයිය හැකි අඩුවීමක් නිරීක්ෂණය කළ හැකි දත්ත මින් පෙන්වීම , ඇතුළත් විය හැකි වේ.

ක්‍රමක්ෂිත පිරිවැයට ගෙන ආ මූල්‍ය වත්කම් සඳහා , තනි තනි වශයෙන් වැදගත් වන මූල්‍ය වත්කම් සඳහා තනි තනි වශයෙන් අඟය අඩුවීම්හි පරමාර්ථ සාක්ෂි තිබේදැයි සංස්ථාව විසින් පළමුවෙන් තනි තනි වශයෙන් අඟයන අතර , තනි තනි වශයෙන් වැදගත් නොවන මූල්‍ය වත්කම් සඳහා සාමූහිකව අඟයයි. වැදගත් වුවත් , නොවුවත් තනි තනි වශයෙන් අඟයනු ලැබූ මූල්‍ය වත්කමක අඟය අඩුවීම පිළිබඳ පරමාර්ථ සාක්ෂියක් නොමැති බව සමූහය විසින් නිශ්චය කළහොත් එය , එම වත්කම සමාන බැර අවදානම් ලක්ෂණ සහිත වත්කම් කාණ්ඩයක ඇතුළත් කරන අතර ඒවා අඟය අඩුවීම සඳහා සාමූහිකව අඟයනු ලැබේ.

අඟය අඩුවීම සඳහා තනි තනි වශයෙන් අඟයනු ලැබූ සහ අඟය අඩුවීමක් සහිත හෝ දිගින් දිගටම හඳුනා ගැනීමට නියමිත වත්කම් අඟය අඩුවීමෙහි සාමූහික ඇඟයීමට ඇතුළත් කරනු නොලැබේ.

ක්‍රමක්ෂිත පිරිවැයට ගෙන ආ වත්කම් මත අඟය අඩුවීමේ අලාභ දරා ඇති බවට පරමාර්ථ සාක්ෂියක් ඇති විට , වත්කමෙහි පවතින වටිනාකම සහ මූල්‍ය වත්කමෙහි මුල් ඵලදායී පොළි අනුපාතිකයට වට්ටම්ගත අනාගත මූල්‍ය ප්‍රවාහ වල වර්තමාන වටිනාකම (නොදරන ලද අනපේක්ෂිත අනාගත ණය අලාභ හැර) අතර වෙනසින් අලාභයෙහි ප්‍රමාණය අඟයනු ලැබේ. ණයක් සඳහා වෙනස් වන පොළි අනුපාතියක් පවතී නම් . යම් අඟය අඩුවීමේ අලාභයක් ඇඟයීම සඳහා වට්ටම්ගත අනුපාතය වන්නේ වර්තමාන ඵලදායී පොළී අනුපාතයයි. වත්කමෙහි පවතින වටිනාකම දීමනා ගිණුමක් භාවිතා කිරීම හරහා අඩු වන අතර , හානිවන ප්‍රමාණය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ. පොළී ආදායම . අඩු වූ පවතින වටිනාකම මත එක්රැස් වීම පවත්වා ගෙන යනු ලබන අතර එය අඟය අඩු වීමේ අලාභ ඇඟයීමේ කාර්යය සඳහා අනාගත මුදල් ප්‍රවාහ වට්ටම්ගත කළ පොළී අනුපාතය භාවිතා කරමින් එක් රැස් කරනු ලැබේ. ආදායම් ප්‍රකාශනයෙහි ආයෝජන ආදායම් වල කොටසක් ලෙස පොළී ආදායම වාර්තා කරනු ලැබේ. අනාගත අය කර ගැනීමෙහි තාත්වික අපේක්ෂාවන්ක නොමැති විට ආශ්‍රිත දීමනා සමඟින් ණය කපා හරිනු ලබන අතර , සියලු සුරැකුම් සමූහයට උපලබ්ධි කර හෝ පවරාගෙන ඇත. ආසන්න වර්ෂයකදී අගය අඩුවීම හඳුනා ගැනීමෙන් පසු යම් හේතුවක් නිසා ඇස්තමේන්තුගත අඟය අඩුවීමේ අලාභය වැඩි වේ නම් හෝ අඩු වේනම් දීමනා ප්‍රමාණය සීරුමාරු කර පෙර හඳුනා ගනු ලැබූ අඟය අඩුවීමේ අලාභය වැඩි හෝ අඩු කරනු ලැබේ.

අනාගත කපා හැරීමක් පසුව අය කර ගතහොත් එම අය කිරීම ආදායම් ප්‍රකාශනයෙහි දීමනා (Allowance) ගිණුමට ගලපනු ලැබේ.

(ආ) අනෙකුත් මූල්‍යමය නොවන වත්කම් හානිකරණය

වත්කමක පවත්නා අගය අය කර ගත නොහැකි බව පෙනෙන පරිසරයකදී හානිකරණය සඳහා විමසා බැලීමට යටත් වේ. පවතින වටිනාකම එහි ඇස්තමේන්තුගත අය කර ගත හැකි වටිනාකම ඉක්මවා යන්නේනම් අඟය අඩුවීමක අලාභයක් හඳුනා ගනු ලැබේ. වත්කමක අය කර ගත හැකි වටිනාකම වන්නේ එහි භාවිතා කරනු ලබන වටිනාකම සහ එහි සාධාරණ වටිනාකමින් විකුණුම් පිරිවැය අඩු කළ විට ලැබෙන වටිනාකම යන ඒවායින් ඉහළ අගය වේ.

2.2.6 හඳුනා ගැනීම අත් හැරීම.

මූල්‍ය වත්කමක් (හෝ කොටසක් හෝ සමූහයක කොටසක් ඇතුලුව) හඳුනා ගැනීම අත් හරින අවස්ථා මෙසේය.

- මූල්‍ය ප්‍රවාහයන් ලැබීමේ අයිතිය ඉකුත් වීම.
- සංස්ථාව විසින් වත්කම මඟින් මුදල් ප්‍රවාහයන් ලැබීමේ අයිතිය පැවරීම හෝ ලැබුණු මුදල් ප්‍රවාහයන් තුන්වන පාර්ශවයකට පවරා දිය යුතු යැයි උපකල්පනය කිරීම.

(අ) සංස්ථාව විසින් සියලු ප්‍රතිලාභ හා අවදානම් පවරා දීම.
(ආ) සංස්ථාව විසින් සියලු ප්‍රතිලාභ හා අවදානම් පවරා දීමක් හෝ රඳවා ගැනීමක් නොකොට පාලන අයිතිය පැවරීම.

2.2.7 නීතිමය අයිතියක් ඇති අවස්ථා වල මූල්‍ය වත්කම් හා වගකීම් සමාහරණය කොට ශුද්ධ අගය දක්වා ඇත.

2.3. දේපළ , යන්ත්‍ර හා උපකරණ

2.3.1 හඳුනා ගැනීම හා මැනීම.

දේපළ , යන්ත්‍ර හා උපකරණ අයිතමයන් ඒවායේ සමුච්චිත ක්ෂය සහ හානිකරණ අලාභ අඩු කිරීමෙන් පසු පිරිවැයට හෝ තක්සේරු අගයට පෙන්වා ඇත. පිරිවැය තුළ වත්කම අත් කර ගැනීමේදී දැරූ වියදම් වලින් සෘජුවම අදාල වන වියදම් ඇතුලත් වේ. ස්වයං නිර්මිත වත්කම් වල එම වත්කම් භාවිත තත්ත්වයට ගෙන ඒම සඳහා දැරූ ද්‍රව්‍යය පිරිවැය , සෘජු ශ්‍රමය , සෘජුවම බලපාන වෙනත් අදාල වියදම් ඇතුළත් වේ. අළුත්වැඩියා හා ඉදිරි අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ වෙනුවෙන් දරන ලද වියදම් ඒවා දරන අවස්ථාවේ වියදම් ලෙස හඳුනාගෙන ඇත.

2.3.2 පසුකාලීන පිරිවැය

උපාංග ප්‍රතිපූර්ණය සඳහා දරන ලද වියදම වෙන් වෙන්ව එනම් පුළුල් පරීක්ෂාවන් හා පූර්ණ අළුත්වැඩියා වියදම් ප්‍රාග්ධනගත කෙරෙන්නේ ඒවායේ ආර්ථික ප්‍රතිලාභ ලැබීමට හේතු වන්නේනම් හා එම ප්‍රතිලාභ විශ්වාසදායකව මැනිය හැකි නම්ය. දෛනික සේවා කිරීම් ඒවා දරන අවස්ථාවේදී ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබේ.

2.3.3 ක්ෂය වීම්

ක්ෂය සඳහා වෙන් කිරීම සරල මාර්ග ක්‍රමය අනුව පිරිවැය/තක්සේරු අගය මත ගණනය කෙරේ. ඉඩම් හැර දේපළ , යන්ත්‍ර හා උපකරණ පහත දැක්වෙන ප්‍රතිශත අනුව ප්‍රයෝජනවත් ආයු කාලය තුළදී ශේෂය ගණනය කෙරේ.

ගොඩනැගිලි	-	ප්‍රධාන කාර්යාලය	2.5%
	-	ශ්‍රවණාගාරය	5%
චිත්‍රපට සංකීර්ණය	-	ගොඩනැඟිලි	5%
	-	අනෙකුත් යන්ත්‍ර සුත්‍ර	10%
ලී බඩු සවි කිරීම්			25%
මෝටර් රථ			25%
චිත්‍රපට සංරක්ෂණාගාරය			10%
සංස්කෘතික / අධ්‍යාපනික / චිත්‍රපට උපකරණ			10%
චිත්‍රපට උපකරණ			10%
සුභසාධන උපකරණ			10%

දේපළ පිරියත හා උපකරණ මිළදී ගත් දිනෙන් ආරම්භව ක්ෂය කරනු ලැබේ.

2.3.4 හඳුනා ගැනීම ඉවත් කිරීම.

දේපළ , පිරියත සහ උපකරණ අයිතමයක පවතින වටිනාකම අපහරණයකදී හෝ ඒවායින් අනාගත ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා ගැනීම නතර වේ. දේපළ , පිරියත හා උපකරණ අයිතමයක් හඳුනා නොගැනීමෙන් ඇතිවන ලාභය හෝ අලාභය අයිතමය හඳුනා නොගන්නා විට අදායම් ප්‍රකාශනයෙහි ඇතුලත් කරනු ලැබේ.

වත්කම් ප්‍රත්‍යාගනනය කිරීම

වත්කම් වර්ගය : වාහන	පිරිවැය	ප්‍රත්‍යාගනන වටිනාකම
43-9025	1,011,841.00	1,200,000.00
WPGA-2729	2,530,300.00	3,500,000.00
WPHM-7716	916,666.50	1,100,000.00
WPHM7708	916,666.50	1,100,000.00
253-3507	1,426,667.00	2,300,000.00
54-6419	956,000.00	1,600,000.00

2.3.5 ස්පෘශ්‍ය වත්කම් හානිකරණය

මූල්‍ය නොවන වත්කම් වල අගය අඩුවීමක කිසියම් ඇඟවීමක් තිබේදැයි නිශ්චය කිරීම සඳහා විලම්භීත බදු වත්කම් හාර සමුහයෙහි මූල්‍යමය නොවන වත්කම් වල පවතින වටිනාකම් ඒ ඒ වාර්තාකරණ දිනට සමාලෝචනය කරනු ලැබේ. එවැනි තත්ත්වයක් ඇත්නම් , එවිට වත්කමෙහි අය කර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. අවිනිශ්චිත ඵලදායි ආයු කාලයක් සහිත හෝ මේ වන තෙක් භාවිතය සඳහා නොපවතින අස්පෘශ්‍ය වත්කම් සඳහා අය කර ගත හැකි වටිනාකම එක් එක් වර්ෂයේදී එම අවස්ථාවේදීම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක හෝ මූල්‍ය උත්පාදක ඒකකයක පවතින වටිනාකම එහි ඇස්තමේන්තුගත අය කර ගත හැකි වටිනාකම ඉක්මවා යන්නේනම් අගය අඩුවීමක අලාභයක් හඳුනා ගනු ලැබේ. වත්කමක හෝ මූල්‍ය උත්පාදක ඒකකයක අය කර ගත හැකි වටිනාකම වන්නේ එහි භාවිතා කරනු ලබන වටිනාකම සහ එහි සාධාරණ වටිනාකමින් විකුණුම් පිරිවැය අඩු කළ විට ලැබෙන වටිනාකම යන ඒවායින් ඉහළ අගය වේ. භාවිතයේ ඇති වටිනාකම (Value in use) ඇඟයීමේදී , මුදලෙහි

කාලීන අගයෙහි වර්තමාන වෙළෙඳපොල ඇඟයීම පිළිබිඹු කරනු ලබන බඳු පෙර වට්ටම් අනුපාතයක් සහ වත්කමට හෝ මුල්‍ය උත්පාදක ඒකකයට විශේෂිත අවදානම් භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලැබේ.

අඟය අඩුවීම පරීක්ෂා කිරීමේ අරමුණ සඳහා තනි තනිව පරීක්ෂා කළ නොහැකි වත්කම් වෙනත් වත්කම් වලින් මුදල් ගැලීමෙන් විශාල වශයෙන් නිදහස් වන නොකඩවා පාවිච්චියෙන් මුදල් ගැලීම උත්පාදනය කරනු ලබන කුඩාම වත්කම් කාණ්ඩයකට කාණ්ඩගත කරනු ලැබේ. අඟය අඩුවීමේ අලාභ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

2.4 තොග

සියළු තොග පිරිවැය හෝ ශුද්ධ ප්‍රත්‍යාගණන අගය යන දෙකින් අවමයට අගය කෙරේ. පිරිවැය පළමු ඇතුළු - පළමු පිට (FIFO) ක්‍රමය පදනම් කොටගෙන තීරණය කෙරේ.

2.5 ආදායම් බදු

සංස්ථා සේවකයන්ගේ පඩි හා අනෙකුත් දීමනාද , වියදම් වලින් කොටසක් පියවීම සඳහාද , භාණ්ඩාගාරයෙන් මුදල් ලබා දෙනු ලැබේ. භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් සඳහා බදු නොගෙවිය යුතුය යන පදනම මත බදු ගෙවීම සඳහා වෙන් කිරීමක් කර නොමැත.

සංස්ථාව විසින් වාර්ෂිකව ලැබූ ලාභය ආදායම් බදු ගෙවීමෙන් පසු ඇති වූ අතිරික්තයෙන් 24% ක ප්‍රමාණයක් ලාභය වෙනුවෙන් බදු ගෙවිය යුතුය යන්න අපගේ මතය වන අතර , එම ප්‍රමාණය විය යුත්තේ ආදායම් බදු සඳහා සිදු කළ ගැලපුම් කටයුතු වලින් පසු ඉතිරි ශුද්ධ ලාභය යන්න අපගේ විශ්වාසයයි.

2.6 අනෙකුත් වත්කම්

අනෙකුත් වත්කම් වල අනෙකුත් ණයගැතියන් සහ ලැබිය යුතු දෑ , අත්තිකාරම් , තැන්පතු , කලින් ගෙවීම් , ලැබිය යුතු බදු ඇතුළත් වේ.

(අ) <u>අත්තිකාරම් , තැන්පතු , කලින් ගෙවූ වියදම්</u>

එක් මුදල් වර්ෂයකට වඩා වැඩි කාලයක් සඳහා ප්‍රතිලාභ ලැබෙතැයි පෙනෙන යම් සම්බන්ධතාවයක් ඇති වියදම් අත්තිකාරම් , තැන්පතු හා කලින් ගෙවූ වියදම් ලෙස වර්ගීකරණය කරන ලදී. එවැනි වියදම් කාල පදනම මත අදාළ කාල පරිච්ඡේදය තුළ කපා හරිනු ලැබේ.

(ආ) <u>අනෙකුත් ණයගැතියෝ</u>

අනෙකුත් ණයගැතියන් පිරිවැයෙන් හානිකරණය අඩු කළ වටිනාකමට හඳුනාගෙන ඇත.

2.7 <u>මුදල් සහ මුදල් හා සමාන දෑ</u>

ඒවායේ සාධාරණ අගයෙහි වෙනස්වීමට නොසැලකිය යුතු තරමේ අවදානමකට භාජනය වන අත්පත් කර ගත් දින සිට මාස 03 ක් කල් පිරුණු හෝ ඊට අඩු කල් පිරීමක් සහිත සහ සමුහය විසින් එහි කෙටිකාලීන වගකීම් කළමනාකරණය සඳහා යොදා ගන්නා මුදල් ශේෂ සහ ඉල්ලුම් තැන්පතු වලින් මුදල් සහ මුදල් හා සමාන දෑ සමන්විත වේ.

2.8 <u>මූල්‍ය වගකීම්</u>

2.8.1 <u>ආරම්භක හඳුනා ගැනීම හා මැනීම.</u>

LKAS 39 අනුව මූල්‍ය වගකීම් වර්ග කොට ඇත්තේ , උචිත පරිදි ලාභය හෝ අලාභය මඟින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වගකීම් හෝ ණය හෝ ණයට ගැනීම්ය. සංස්ථාව එහි මූල්‍ය වගකීම් ආරම්භක හඳුනා ගැනීම අනුව වර්ගීකරණය නිශ්චය කර ඇත. සියළු මූල්‍ය වගකීම් මුලින්ම සාධාරණ අගයට හඳුනා ගන්නා අතර , ණය හා ණය ගැනුම් සම්බන්ධයෙන් ක්‍රමක්ෂය ක්‍රමය භාවිතා කරයි. මෙහි සෘජුවම අදාළ වන ගනුදෙනු පිරිවැය ඇතුළත්ය.

සංස්ථාවේ මූල්‍ය වගකීම් වල වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ඇතුලත්ය.

2.8.2 පසුකාලීන මිනුම්

මූල්‍ය වගකීම් මිනුම පහත දැක්වෙන පරිදි ඒවායේ වර්ගීකරණය මත පදනම් වේ.

2.8.3 ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම්

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම් වල වෙළඳාම සඳහා වූ මූල්‍ය වගකීම් සහ ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම් මත නම් කරන ලද ඒවා ඇතුළත් වේ. මූල්‍ය වගකීම් , වෙළඳාම සඳහා පවත්නා දේ ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ ඒවා නුදුරේදී විකිණීමේ අරමුණ ඇත්නම්ය. වෙළඳාම සඳහා වගකීම් මත ලැබීම් හෝ පාඩු ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ. සංස්ථාව කිසිදු මූල්‍ය වගකීමක් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට මුලික හඳුනා ගැනීම නම් කර නැත.

2.9 අනෙකුත් මූල්‍ය වගකීම්

ණය සහ ණය ගැනුම් ආරම්භක හඳුනා ගැනීමෙන් පසු අනෙකුත් මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් ක්‍රමාක්ෂය ක්‍රමය භාවිතා කරයි.

උපචිත වියදම්	රු
ගෙවීමට ඇති වැටුප් හා වෙනත්	36,944,646
හිඟ ඊ.පී.එප් -30529142	
හිඟ ඊ.ටී.එප් -4163064	
ගෙවීමට ඇති වැටුප -2252439	
ජනාධිපති සම්මාන උළෙල	9,854,285
වෙනත් වියදම්	8,558,068
අන්තර් ජාල පහසුකම් සැපයීම	1,357,000
ප්‍රවේශ පත්‍ර මුද්‍රණය	305,400
4 k DCP යන්ත්‍රයේ ඉතිරි මුදලින් 60%	6,876,093
	63,895,492

2.10 අනෙකුත් වගකීම්

අනෙකුත් වගකීම් වල උපචිත වියදම් ද ඇතුලත්ය. මේවා ඒවායේ සාධාරණ අගය ලෙස වටිනාකමට දක්වා ඇත.

2.11 රජයේ ප්‍රදාන

වත්කම් වලට අදාළ රජයේ ප්‍රදාන මේවා ශේෂ පත්‍රයේ විලම්භනය කර අදාළ වත්කමේ ආයු කාලය පුරා ආදායම් ප්‍රකාශනයට හඳුනා ගනු ලබන අතර , වියදම් පියවීම සඳහා ලැබෙන්නා වූ ලැබීම් , ලැබීම් පදනම මත ගිණුම්ගත කෙරේ.

භාණ්ඩාගාර ප්‍රදානයන් භාවිතය සමඟ නිසි පරිදි ආදායමට හඳුනා ගැනීම.

LKAS 20 අනුව වත්කම් ගොඩනැගීමට අදාලව රාජ්‍ය භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදානයන් වත්කමෙහි ආයු කාලය පුරා ආදායමට හඳුනා ගැනීම 2018 වර්ෂයට හඳුනා ගත් ආදායම් පහත සඳහන් වේ.

		රු.ශත
නව ගොඩනැගිල්ල	-	1,293,258.53
සිනමා සංකීර්ණය	-	8,535,991.51
ප්‍රධාන කාර්යාලය	-	4,251,471.57
චිත්‍රාගාර යන්ත්‍රසූත්‍ර	-	5,951,587.05
අන්තර් ජාල පහසුකම්	-	135,700.00
		20,168,008,66

ආයතනයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු මුදල - **රු.63,850,000**

2.12 සේවක ප්‍රතිලාභ

නිර්ණය කළ දායක සැලැස්ම

අදාළ ව්‍යවස්ථා හා රෙගුලාසි ප්‍රකාර , සේවක අර්ථසාධක අරමුදල් හා සේවා භාර අරමුදල් දායකත්වය සඳහා සේවකයෝ හිමිකම් ලබති. සංස්ථාව විසින් සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකය මත ස්ථාවර දායකයක් මෙකී අරමුදල් වලට ගෙවන අතර , ඉන් අමතරව නීතිමය හෝ හෝ අර්ථකාරී බැඳීමක් සංස්ථාව කෙරෙහි නොමැත.

නිර්ණය කළ ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් යනු නිශ්චිත දායකත්ව සැලසුමකට වෙනස් වූ පශ්චාත් සේවා නියුක්ත ප්‍රතිලාභ සැලසුමක් වේ. මේ සම්බන්ධව 1983 අංක.12 දරන පාරිතෝෂික පනත යටතේ සංස්ථාව බැඳී සිටී.

2.13 ආදායම

2.13.1 නිෂ්පාදක ණය පොලිය හා අධි භාරය

නිෂ්පාදකයින් වෙත ලබා දී ඇති ණය මුදල් සඳහා පොළිය ගිණුම්ගත කර ඇත්තේ අදාළ චිත්‍රපට ප්‍රදර්ශනය වී අවුරුද්දක් ගත වන තෙක් පමණි. යම් අවස්ථාවක ණය මුදල් සම්පූර්ණ අය වන්නේනම් අදාල පොලියද ගණනය කර අය කිරීමට කටයුතු කරනු ලැබේ.

සිනමාශාලා වලින් අය වීමට ඇති මුදල් සඳහා ගැසට් නිවේදනයේ පරිදි අධිභාරය ගණනය කර ගිණුම්ගත කර තිබේ.

2.13.2 ප්‍රදර්ශනය සඳහා මුදා හැර ඇති චිත්‍රපට

චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමේදී ආදායම නොලැබීම මත ණය මුදල් අය නොවීමේ තත්ත්වයක් තුළ චිත්‍රපට මුදා හැර වසරකට පසු පොළිය ගිණුම්ගත කරනු නොලැබේ.

2.13.3 ප්‍රදර්ශනය නොවූ චිත්‍රපට

(අ) චිත්‍රපට නිෂ්පාදනය සඳහා ණය ලබා දී ඇති එහෙත් පසුගිය වර්ෂ දෙකක සේවාවන් ලබාගෙන නොමැති චිත්‍රපට වලට පොළිය ගිණුම්ගත කර නොමැත.

(ආ) චිත්‍රාගාර සේවා ලබා දීමේදී දීඝ්‍ර කාලයක් තුළ සේවාවන් ලබා නොගෙන නිෂ්පාදන කටයුතු නවතා ඇති චිත්‍රපට සඳහා පොළිය ගිණුම්ගත කොට නොමැත.

ඉහත සඳහන් කරුණු 02 යටතේ වර්ෂයේ පොළිය ගණනය නොකලද , යම් අවස්ථාවක මෙම ණය මුදල් අය කර ගැනීමේදී පොළිය අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

2.13.4 සිනමාහල් අධිභාර

සිනමාශාලා වලින් ලැබිය යුතු චිත්‍රපට කුළිය සඳහා අයවිය යුතු අධිභාර මුදලින් 100% ක් නොලැබේය යන පදනම මත 25% ක් පමණක් ආදායමට ගෙන තිබේ.

2.13.5 224 ගොඩනැගිලි කුලී ආදායම

සංස්ථාවට අයිති වත්කමක් වන 224 ගොඩනැගිල්ල තාවකාලිකව කුලීයට දීමෙන් පහත ආයතනයන්ගෙන් ගොඩනැගිලි කුලි අයකරනු ලබයි.

		මාසික කුලිය	වාර්ෂිකව
01	සැලසිනේ ආයතනය	291,500.00	3,498,000.00
02	ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලය	115,000.00	1,380,000.00
03	සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය	315,000.00	3,780,000.00
		725,000.00	8,658,000.00

2.13.6 සංස්ථා ගිණුමට ඇතුලත් නොවූ ව්‍යාපෘති

01 . Film Education School Children ජංගම ගිණුම් අංක - 5152460

2018.12.31 දිනට ශේෂය 976,303.16

02.සිනමා ශිල්පීන්ගේ රක්ෂණය

ස්ටැන්ඩඩ් චාටර්ඩ් බැංකුව ගිණුම් අංක - 01 3514633 01

මෙම ව්‍යාපෘතිය සඳහා පුද්ගලිකව මුදල් යොදාවා ඇත. දැනට ගිණුම් ශේෂයන් නොමැත.

2.13.7 2017 වර්ශයේ ගිණුම් සටහන් වලට යොදා නොමැති සටහන්

2017 වර්ෂයේ ජනාධිපති සම්මාන උලෙළ

ලැබීම් - භාණ්ඩාගාර ලැබීම්		33,000,000.00
සංස්ථා දායකය		10,000,000.00
		43,000,000.00
අඩු කලා - වියදම		44,394,713.31
හිඟ		1,394,717.31

			2017
		රු.	රු.
(03) විකුණුම්			
එළිය කැවූ චිත්‍රපට	3.1	38,916,762	45,278,949
ප්‍රදර්ශන	3.2	612,770	314,090
චිත්‍රාගාරය	3.3	1,292,200	2,253,125
වෙළඳ කටයුතු	3.4	2,256,939	2,272,377
		43,078,671	**50,118,541**

3.1 එළිය කැවූ චිත්‍රපට

දේශීය චිත්‍රපට කුළිය	12,942,272	17,916,627
පෙරදිග චිත්‍රපට කුළිය	11,655,093	12,201,966
බෙදා හැරීමේ කොමිස්		
දේශීය	8,506,324	8,720,372
විදේශීය	230,497	98,886
වැඩිවීම	4,889,096	5,110,118
සේවාවන් සඳහා කොමිස්	693,480	1,230,980
අධිභාරය	**38,916,762**	**45,278,949**
පරීක්ෂණ දඩ මුදල්		

3.2 ප්‍රදර්ශන

සිනේ ඇඩිස්	612,770	314,090
	612,770	**314,090**

3.3 චිත්‍රාගාරය

	චිත්‍රපට ප්‍රමාණය		චිත්‍රපට ප්‍රමාණය	
ශබ්ද	18	1,240,300	23	1,778,800
සංස්කරණය	5	51,900	4	474,325
රසායනාගාරය (කළු - සුදු)		-		-
		1,292,200		**2,253,125**

3.4 වෙළඳ කටයුතු

	ප්‍රමාණය		ප්‍රමාණය	
සිනමා කාබන්	2,500	129,995	7,650	379,855
අමතර කොටස්		14,595	-	42,624
ලිපි ද්‍රව්‍යය		1,651,782	-	1,810,227
අභ්‍යන්තර භාවිතය				
අමතර කොටස්		16,266		3,987
ලිපි ද්‍රව්‍යය පිරිවැය		444,301		35,684
		2,256,939		**2,272,377**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2018.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

(04) විකුණුම් පිරිවැය

	ප්‍රදර්ශන	චිත්‍රාගාරය	පොදු පරිපාලන වියදම්	2018 එකතුව	2017 එකතුව
	රු.	රු.	රු.	රු.	රු.
තොගය 2018.01.01	5,253,887	1,409,412	4,494,941	11,158,240	12,073,168
එකතු කළා :					
මිලදී ගැනීම් හා මාරු කිරීම්	-	-	2,465,631	2,465,631	2,258,507
	5,253,887	1,409,412	6,960,572	13,623,871	14,331,675
අඩු කළා :					
තොග පාඩුවීම්	-				
මාරු කිරීම්	-				
2018.12.31 අවසන් තොගය	5,253,887	1,409,412	5,156,233	11,819,532	11,158,240
	-	-	**1,804,339**	**1,804,339**	**3,173,435**

දීර්ඝ සටහන් සඳහා (4- ඒ) , (4-බී) සහ (4- සී) සටහන් බලන්න.

) විකුණුම් පිරිවැය

	තොගය 2018.01.01	මිලදී ගැනීම්	එකතුව	තොගය 2018.12.31	ක්ෂයවීම්	ප්‍රචාරණය	මූළු පිරිවැය	වැඩිවීම	බෙදාහැරීමේ ලැබීම්	මූළු ලැබීම්	ලාභය / අලාභය
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
එළිය කැවූ චිත්‍රපට											
දේශීය	3	-	3	3	-	-	-	-	-	-	-
බටහිර	244	-	244	244	-	-	-	-	-	-	-
පෙරදිග	471	-	471	471	-	-	-	-	-	-	-
	718	-	718	718	-	-	-	-	-	-	-
මුදා නොහල චිත්‍රපට									-	-	-
දේශීය	3,043,931	-	3,043,931	3,043,931	-	-	-	-	-	-	-
බටහිර	982,492	-	982,492	982,492	-	-	-	-	-	-	-
පෙරදිග	8	-	8	8	-	-	-	-	-	-	-
එකතුව	4,026,431	-	4,026,431	4,026,431	-	-	-	-	-	-	-
	4,027,149	-	4,027,149	4,027,149	-	-	-	-	-	-	-

		2018	2017
		රු.	රු.
තොගය 2018.01.01		-	-
එකතු කළා :	මිලදී ගැනීම්	-	-
	ප්‍රචාරණය	-	-
		-	-
අඩු කළා :	තොගය 2018.12.31	-	-
	පිරිවැය	-	-
එකතු කළා:	අනෙකුත් චිත්‍රපට		
තොගය 2018.01.01			
I. ප්‍රතිශත පදනම මත	259,890	-	259,890	
II. සිනේ සිත්තම්	966,848	1,226,738	966,848	1,226,738
එකතු කළා :	වියදම්	-	-
		1,226,738	1,226,738
අඩු කළා :			
	මාරු කිරීම්		
තොගය 2018.12.31			
I. ප්‍රතිශත පදනම මත	259,890	-	259,890	-
II. සිනේ සිත්තම්	966,848	1,226,738	966,848	1,226,738
මූළු පිරිවැය		-	-	-

4 - B) විකුණුම් පිරිවැය

	දළ සේයාපට	සිනමා කාබන්	අමතර කොටස්	රසායන ද්‍රව්‍යය	ලිපි ද්‍රව්‍යය	එකතුව 2018	එකතුව 2017
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ආරම්භක තොගය 2018.01.01	287,951	934,936	299,531	-	2,972,523	4,494,941	5,330,937
එකතු කළා :							
මිලදී ගැනීම් හා මාරු කිරීම්		187,287			2,278,344	2,465,631	2,258,507
	287,951	1,122,223	299,531	-	5,250,867	6,960,572	7,589,444
අඩු කළා :							
තොග හානිවීම්							
2018.12.31 අවසන් තොගය	287,951	1,170,579	277,864	-	3,419,839	5,156,233	4,494,941
	-	**(48,356)**	**21,667**	-	**1,831,028**	**1,804,339**	**3,094,503**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2018.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන් (චිත්‍රාගාරය)

(04 - C) විකුණුම් පිරිවැය

	දළ සේයාපට	සිනමා කාබන්	අමතර කොටස්	රසායන ද්‍රව්‍ය	එකතුව **2017**	එකතුව **2017**
	රු.	රු.	රු.	රු.	රු.	රු.
ආරම්භක තොගය - 2018.01.01	816,569	-	538,753	54,090	1,409,412	1,488,344
මිලදී ගැනීම්	-	-	-	-		
	816,569	-	538,753	54,090	1,409,412	1,488,344
අඩු කළා :						
තොග හානිවීම	-	-	-	-	-	-
මාරු කිරීම්	-	-	-	-	-	-
2018.12.31 අවසන් තොගය	816,569	-	538,753	54,090	-	1,409,412
වර්ෂය තුළ අභ්‍යන්තර පාවිච්චිය	-	-	-	-	-	**78,932**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2018.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

සටහන : 05

	එකතුව 2018 රු.	එකතුව 2017 රු.
සේවක පාරිශ්‍රමිකය		
වැටුප් හා වේතන	42,973,075	39,884,469
අතිකාල, නිවාඩු පඩි හා වන්දි	4,838,815	3,182,659
සේවක අර්ථසාධක හා භාරකාර අරමුදලට දායක මුදල්	8,074,850	7,435,031
වෙනත් දීමනා	24,728,678	30,120,380
	80,615,418	**80,622,539**

සටහන : 06

ගමන් හා යැපීම් දීමනා

ගමන් වියදම්	(දේශීය)	121,719	81,086
	(විදේශීය)	1,077,204	1,055,574
යැපීම් දීමනා		190,251	277,923
		1,389,174	**1,414,583**

සටහන : 07

	එකතුව 2018 රු.	එකතුව 2017 රු.
සැපයුම් හා උපකරණ		
ලිපි ද්‍රව්‍යය හා කාර්යාලීය උපකරණ	2,065,529	1,998,142
විදුලිය	4,869,052	4,988,081
සංග්‍රහ වියදම්	189,929	326,289
යාන්ත්‍රික හා විදුලි උපකරණ	73,645	163,315
නිල ඇඳුම්	-	
	7,198,155	**7,475,827**

සටහන : 08

අළුත්වැඩියා කිරීම් , නඩත්තු හා ක්ෂයවීම්

ඉන්ධන, ලිහිසි තෙල් හා රථවාහන නඩත්තු	4,732,663	3,809,619
නඩත්තු	2,449,990	2,016,370
ක්ෂයවීම්	25,755,076	23,554,903
	32,937,729	**29,380,892**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2018.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

සටහන : 09

	එකතුව 2018 රු.	එකතුව 2017 රු.
ප්‍රවාහන , සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවාවන්		
ප්‍රවාහනය	64,382	72,072
සම්බන්ධතා	2,483,811	2,185,088
අවශ්‍යතා		
අභ්‍යන්තර පාවිච්චිය	460,567	1,434,388
විදේශීය චිත්‍රපට උළෙල	-	
සුභසාධක වියදම්	2,941,760	2,915,567
සේවක බඳවා ගැනීම් හා පුහුණුව	719,647	166,740
ජල බිල්පත්	404,093	173,648
සාකච්ඡා හා සම්මන්ත්‍රන	247,477	208,508
චිත්‍රපට සංරක්ෂණය	2,241,138	3,861,506
වරිපනම් බදු	829,313	766,111
වෙනත් සේවා		
අධ්‍යක්ෂක ගාස්තු	837,099	898,690
ප්‍රචාරණය	709,829	306,182
විශේෂ කොමිෂන් ගාස්තු	370,379	28,165
නීති ගාස්තු	489,415	977,154
සංස්ථා උළෙලයන්	1,267,391	1,977,244
විගණන ගාස්තු	700,000	700,000
ආරක්ෂක සේවා	5,169,591	3,222,280
බැංකු ගාස්තු	83,750	66,866
සිනමා අධ්‍යාපන	705,865	863,062
පිටස්තර මරණාධාර හා සිනමා ශිල්පීය වියදම්	943,635	898,800
නව සිනමාහලේ වියදම්	484,240	259,402
රඳවා ගැනීමේ බදු	-	-
තිර නාටක කියවීම	6,000	-
ප්‍රමාද ගාස්තු	10,872	2,658
ටෙන්ඩර් වියදම්	-	44,476
ස්ථාවර වත්කම් ඉවත් කිරීම	-	-
සනිපාරක්ෂක සේවා	2,310,301	2,643,729.00
සේවක ණය පොළී පිරිවැය	968,843	953,005
(-) සේවක ණය පොළී ආදායම	(968,843)	(953,005)
ස්තවර වත්තම් ඉවත් කිරීමේ අලාභය	6	-
	24,480,561	**24,672,336**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2018.12.31 දිනට අවසන් වර්ෂයේ
ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

සටහන : 10

වෙනත් ආදායම්

	2018	2017
	රු.	රු.
ලාභාංශ ආදායම	20,000	33,694
නිෂ්පාදන ණය පොලී	2,163,409	859,172
සේවක ණය පොලී	484,421	457,199
විවිධ ආදායම්	2,960,735	910,804
පිටස්තර රූගත කිරීම්	4,580,700	1,750,274
සංස්ථාවට අයත් නොවන චිත්‍රපට අළුත්වැඩියා කිරීම් සඳහා	120,417	313,030
ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොලී	25,428,638	26,419,833
අයඳුම්පත් ගාස්තු	883,000	432,000
එන්.එෆ්.සී. සිනමාහලේ ආදායම	4,329,875	4,555,125
චිත්‍රපට නැරඹීම සඳහා ලැබීම්	-	-
ජනාධිපති සම්මාන උළෙළ සඳහා වෙන් කිරීම් ගිණුමින් මාරු කිරීම්	-	-
තිරනාටක සඳහා අනුමැතිය	5,000	-
224 ගොඩනැගිලි කුලී ආදායම	8,658,000	8,340,000
පාඨමාලාවන් සඳහා ලැබීම්	1,542,000	162,000
භාණ්ඩාගාර ලැබීම් ආදායමට හඳුනා ගැනීම්	20,168,009	21,972,624
විනිමය අනුපාත ගැලපීම	99,345	73,514
දේශන ශාලාවේ ආදායම්	166,150	103,250
රක්ෂණ සංස්ථාවෙන් ලද වන්දි	11300	131,558
ප්‍රචාරක පුවරු	7500	-
වත්කම් ඉවත්කම් කිරීමේ ගිණුම	50249	-
විදේශ චිත්‍රපට ආනයනකරුවන් ලියාපදිංචි ගාස්තු	575,000	-
සේවක දඩ මුදල්	466,999	-
	72,720,747	**66,514,077**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2018 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

ාහන : 11 - ස්ථාවර වත්කම්
පල , යන්ත්‍ර සූත්‍ර හා උපකරණ

	පිරිවැය	වර්ෂය තුල එකතු කිරීම්	වර්ෂය තුල ඉවත් කිරීම්	පිරිවැය	සමුච්චිත ක්ෂයවීම්	වර්ෂය සඳහා ක්ෂයවීම්	සමුච්චිත ක්ෂයවීම්	ශුද්ධ අගය
	2018.01.01			**2018.12.31**	**2018.01.01**			**2018.12.31**
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
01. සින්නක්කර ඉඩම්	174,343,458	-	-	174,343,458	-		-	174,343,458
02. සින්නක්කර ගොඩනැගිලි	145,740,310	1,126,280	-	146,866,590	55,189,648	5,743,247	60,932,895	85,933,695
03. සිනමා සංකීර්ණය	119,571,471	6,218,233	-	125,789,704	65,065,736	9,148,038	74,213,774	51,575,930
04. මිනි සිනමා උපකරණ	331,451	-	-	331,451	331,449	-	331,449	2
05. ලී බඩු , සවි කිරීම් හා වෑද්දුම්	17,940,747	911,030	-	18,851,777	15,929,270	421,544	16,350,814	2,500,963
06. කාර්යාලීය උපකරණ	19,615,545	6,107,383	-	25,722,928	15,902,528	1,471,414	17,373,942	8,348,986
07. මෝටර් රථ	15,297,820	10,800,000	7,914,941	18,182,879	7,382,877	2,700,000	10,082,877	8,100,002
08. චිත්‍රපට සංරක්ෂණය	1,610,655	-	-	1,610,655	1,159,645	97,279	1,256,924	353,731
09. පාපැදි	18,281	-	-	18,281	18,277	-	18,277	4
10. චිත්‍රපට උපකරණ	910,689	-	-	910,689	713,550	49,280	762,830	147,859
11. ප්‍රක්ෂේපණ උපකරණ	925,202	-	-	925,202	553,730	50,209	603,939	321,263
12. චිත්‍රාගාර යන්ත්‍ර සූත්‍ර	93,301,972	457,020	-	93,758,992	79,837,974	5,997,289	85,835,263	7,923,729
13. සිනමා අධ්‍යාපන උපකරණ	1,241,350	-	-	1,241,350	886,540	75,204	961,744	279,606
14. සුභසාධන උපකරන	210,677	-	-	210,677	196,531	1,572	198,103	12,574
	591,059,628	**25,619,946**	**7,914,941**	**608,764,633**	**243,167,755**	**25,755,076**	**268,922,831**	**339,841,802**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2018 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

			2018		2017
			රු.		රු.
සටහන : 12					
දිගු කාලීන ආයෝජන					
ස්ථාවර තැන්පතු			21,461,312		19,562,022
සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම			127,000		127,000
			21,588,312		**19,689,022**
සටහන : 13					
කෙටි කාලීන ආයෝජන					
ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පතු සේවක			5,000		5,000
රිපෝ තැන්පතු			187,811,682		173,097,656
භාණ්ඩාගාර බිල්පත්			108,004,238		100,117,116
			295,820,920		**273,219,772**
සටහන : 14					
තොග					
චිත්‍රපට			5,253,887		5,253,887
වෙළඳ කටයුතු			4,868,282		4,206,990
චිත්‍රාගාරය			1,697,363		1,697,363
චිත්‍රාගාරය නඩත්තු අමතර කොටස්			1,472,575		1,472,575
ලිපි ද්‍රව්‍යය හා වෙනත්			1,355,399		1,369,045
			14,647,506		13,999,860
සෙමින් අලෙවි වන සහ අලෙවි නොවන තොග සඳහා වෙන් කිරීම්			(8,597,176)		(8,597,176)
			6,050,330		**5,402,684**
සටහන : 15					
ණයගැතියෝ					
සිනමාහල්	348,893,245		301,745,885		
(-) අධිභාර වෙන් කිරීම්	(134,159,069)		(119,490,277)		
(-) ණයගැතියන් සඳහා හානිකරණ ගැලපීම 16ඒ	(110,944,780)	103,789,396	(86,668,793)		95,586,815
නිෂ්පාදකයෝ	92,109,979		92,928,307		
(-) නිෂ්පාදන ණය පොලි වෙන් කිරීම්	(4,618,806)		(4,618,805)		
(-) ණයගැතියන් සඳහා හානිකරණ ගැලපීම 16ඒ	(63,906,276)	23,584,897	(66,664,593)		21,644,909
		127,374,293			**117,231,724**
සටහන : 16					
විවිධ ණයගැතියෝ					
වෙනත්			176,195,054		162,747,665
විවිධ ණයගැතියෝ සඳහා හානිකරන ගැලපීම(සටහන 16 ඒ)			(8,809,753)		(8,137,000)
සේවක අත්තිකාරම්			23,350,831		21,239,522
සේවක ණය වත්කම් ගිණුම			3,224,642		12,289,064
(-) සේවක ණය වගකීම් ගිණුම			(3,224,642)		(12,289,064)
			190,736,132		**175,850,187**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2018 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

අඩමාන ණය සඳහා වෙන් කිරීම් උපලේඛනය

සටහන : 16 ඒ

ණයගැතියෝ	එකතුව 2018	එකඟ නොවූ හා අය කර ගත නොහැකි	අය කර ගත හැකි	5% වෙන් කිරීම්	මුළු වෙන් කිරීම්
	රු.	රු.	රු.	රු.	රු.
සිනමාහල්	348,893,245	98,421,177	250,472,068	12,523,603	110,944,780
නිෂ්පාදකයන්	92,109,979	62,421,871	29,688,108	1,484,405	63,906,276
වෙනත්	176,195,054		176,195,054	8,809,753	8,809,753
සේවක ණය	23,346,291		23,346,291		
	640,544,569	**160,843,048**	**479,701,521**	**22,817,761**	**183,660,809**

ශේෂය ඉ / ගෙ	161,470,386	86,668,793	66,664,593	8,137,000	
ලාභාලාභ ගිණුමට මාරු කළා	22,190,423	24,275,987	(2,758,317)	672,753	
	183,660,809	**110,944,780**	**63,906,276**	**8,809,753**	-

ණයගැතියන් සඳහා හානිකරන ගැලපීම්	
2018.01.01 දිනට	161,470,386
ලාභාලාභ ගිණුමට මාරු කළා	22,190,423
ශේෂය ප/ගෙ 2018.12.31	**183,660,809**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2018 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

	2018 රු.	2017 රු.
සටහන : 17		
නැන්පතු හා ඉදිරියට ගෙවීම්		
නැන්පතු	4,209,588	3,768,432
අත්තිකාරම් ගෙවීම්	321,574	800,719
	4,531,162	4,569,151
නොලැබිය හැකි ණය සඳහා හානිකරන ගැලපීම	(653,728)	(653,728)
	3,877,434	**3,915,423**
සටහන : 18		
මුදල් හා බැංකු ශේෂ		
මහජන බැංකුව - ජ. ගි. අ. 004-1-001-1-0208647	1,585,453	1,325,524
මහජන බැංකුව - ජ. ගි. අ. 055-1-001-5-0667533	2,124,340	901,745
මහජන බැංකුව - ජ. ගි. අ. 004-1-001-6-0208664	7,166,206	19,019,734
ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323272	4,863,086	7,074,511
ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323131	952,745	1,594,638
ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323354	6,296,658	19,940,390
ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323363	6,715,678	25,572,737
ලංකා බැංකුව - ජ. ගි. අ. 0005002189	5,223,378	15,120,013
ලංකා බැංකුව - ජ. ගි. අ. 5152460	976,303	
	35,903,847	90,549,292
අන ඉතිරි මුදල්		
සුළු මුදල් - ප්‍රධාන කාර්යාලය	48,971	35,345
සුළු මුදල් - චිත්‍රාගාරය	(4,805)	4,297
සුළු මුදල් - චිත්‍රපට ගබඩාව	34	34
	44,200	39,676
එකතුව	**35,948,047**	**90,588,968**
සටහන : 19		
ප්‍රදානයන්		
ගිණුම්ගාර ප්‍රදානයන්	124,349,919	146,322,543
(-)ක්‍රමක්ෂය	(20,168,009)	(21,972,624)
	104,181,910	**124,349,919**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2018 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

	2018	2017
	රු.	රු.
සටහන : 20		
පාරිතෝෂික වෙන් කිරීම්		
ඉදිරියට ගෙනා ශේෂය - 2018.01.01	40,228,205	35,932,903
2017 වර්ෂයේ අධි වෙන් කිරීම	-	(102,235)
වර්ෂය සඳහා වෙන් කිරීම්	7,131,374	6,626,608
ගුදල් ගෙවීම්	(4,208,523)	(2,229,071)
	43,151,056	**40,228,205**
(භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කර ඇත.)		
සටහන : 21		
තැන්පතු		
එන්.එෆ්.සී. සිනමාශාලා ඇප තැන්පතු	295,272	310,000
ආපනශාලා තැන්පතු	30,000	30,000
ආරක්ෂක තෑ සිනමාශාලා	2,326,727	2,326,727
සේවක	5,000	5,000
චිත්‍රපට ආනයන	7,500	7,500
සිනමා ව්‍යාපෘතිය	45,000	45,000
සනිපාරක්ෂක සේවා	260,000	160,000
	2,969,499	**2,884,227**
සටහන : 22		
චිත්‍රපට කුලී ණයහිමියෝ		
චිත්‍රපට කුලී ණයහිමියෝ	271,145,270	276,979,852
(-) ණයහිමියන් සඳහා හානිකරන ගැලපීම	(18,046,804)	(18,046,804)
	253,098,466	**258,933,048**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2018 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

සටහන : 23

	2018 රු.	2017 රු.
වෙනත් ණයහිමියෝ		
උපචිත වියදම් (මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 2.10 (	63,895,493	25,238,340
ගෙවිය යුතු එකතු කල අගය මත බදු	152,613	152,613
විගණන ගාස්තු ප්‍රතිපාදන	2,515,795	2,286,720
දේශීය ආදායම් කොමසාරිස් (මුද්දර)	75,022	81,447
හිමිකම් නොපෑවේතන	944,912	998,494
සේවක අර්ථසාධක අරමුදල	656,726	666,426
සේවක භාරකාර අරමුදල	72,955	74,278
විවිධ ණයහිමියෝ	759,853	752,877
(-) නොගෙවිය යුතු වගකීම් සඳහා වෙන් කිරීම්	(644,840)	(644,840)
විවිධ ණයගැතියෝ (බැර ශේෂය)	-	-
චිත්‍රපට කුලී ණයගැතියෝ	-	-
මහා භාණ්ඩාගාරය	5,000,000	5,000,000
ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල	3,557,545	3,650,545
රිත්මා මණ්ඩල පාලන ගිණුම	5,542,572	5,763,596
චිත්‍රපට උත්සව සඳහා වෙන් කිරීම් ගිණුම	-	-
උපයන විට බදු ගෙවීම	35,304	33,564
වැටුප් හා වේතන වෙන් කිරීමේ ගිණුම	550,887	550,887
ලැබිය යුතු නිෂ්පාදන ණය පොළී වෙන් කිරීම	1,028,122	1,506,922
සුබ සාධක සංගමයට මරණාධාර අත්තිකාරම්	46,150	4,950
ප්‍රසිද්ධ රූගම් පාලක මණ්ඩලය	682,973	682,973
චිත්‍රපට ප්‍රතිශ්ඨාපනය	2,446,017	-
	87,318,099	**46,799,792**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2018.12.31 දිනට අවසන් වර්ෂයේ

විස්තීරණ ආදායම් ප්‍රකාශනය

2017.12.31 දිනට අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

		SLFRS 2017 රු.	මැනිය හැකි වෙනස්වීම් රු.	SLFRS 2017 රු.
විකුණුම්	සටහන 01	50,118,541	87,150	50,031,391
අඩු කළා : විකුණුම් පිරිවැය	සටහන 02	(3,173,435)	141,966	(3,031,469)
දළ ලාභය		46,945,106	54,816	46,999,922
අඩු කළා : වියදම්				
සේවක පාරිශ්‍රමික		80,622,539		80,622,539
ගමන් හා යැපීම් දීමනා		1,414,583		1,414,583
සැපයුම් හා උපකරණ		7,475,827		7,475,827
අවත්වැඩියා කිරීම් නඩත්තු හා ක්ෂයවීම්				
අවත්වැඩියා කිරීම් හා නඩත්තු ක්ෂයවීම්	සටහන 03	29,380,892	-	29,380,892
ප්‍රවාහන , සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා		24,672,336	301,354	24,370,982
බොල් ණය සඳහා වෙන් කිරීම්		14,736,803		14,736,803
පාරිතෝෂික වෙන් කිරීම්		6,626,608		6,626,608
චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල් සඳහා වෙන් කිරීම්		500,000		500,000
ජාතික චිත්‍රපට උත්සව වෙන් කිරීම්		-		-
		165,429,588	356,170	165,128,234
මෙහෙයුම් ලාභය / අලාභය		(118,484,482)		(118,128,312)
එකතු කළා : වෙනත් ආදායම්	සටහන 04	66,514,077	1,003,799	65,510,278
වර්ෂයේ ලාභය / අලාභය		(51,970,405)		(52,618,034)
අඩු කළා : භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල්		81,000,000		81,000,000
බදු පෙර ලාභය		29,029,595		28,381,966
අඩු කළා : බදු සඳහා වෙන් කිරීම්		-		-
ශුද්ධතාවය / අතිරික්තය		**29,029,595**	**647,629**	**28,381,966**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2018 දෙසැම්බර් 31 දිනට

සටහන්

ඇමුණුම

සටහන	විස්තරය	මුදල රු.ශත
සටහන 01	චිත්‍රාගාරසේවා වෙනුනේ වැඩිපුර ලබා ගත් මුදල	(87,150)
සටහන 02	2017 වර්ෂයේ තොගය අඩුවෙන් ගිණුම්ගත කිරීම	141,966
සටහන 03	චෙක්පත් අවලංගු කිරීම (130097.8+37500)	301,354.00
සටහන 04	ගිණුම්ගත කිරීම නිවැරදි කිරීම (213213+4456.69)	(1,003,796)
		(647,626)
සටහන ඒ	සමුච්චිත ලාභයට ගැලපීම්	
	2006 වර්ෂයේ සිට ජීවනාංක දීමනාවට ගනනය නොකල ගෙවිය යුතු හිග සේ.අ.අ	30,529,142
	2006 වර්ෂයේ සිට ජීවනාංක දීමනාවට ගනනය නොකල ගෙවිය යුතු හිග සේ.හා.අ	4,163,064
		34,692,206

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2018 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

සටහන 26

අධ්‍යක්ෂ මණ්ඩල සබඳතා

ආයතනයේ මූල්‍ය හා මෙහෙයුම් තීරණ වලට බලපෑම් සිදු කළ හැකි කිසිදු ගණුදෙනුවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කර නොමැත. 2018 වසරේ අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් පහත දක්වා ඇත.

අං	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම	පත්වීම් දිනය	දරන තනතුර හා සේවා ස්ථානය/ලිපිනය	ලිපිනය
1	සිතේන්ද්‍ර සේනාරත්න මහතා	2017.06.29 නැවත පත් කිරීම 2018.06.07 සිට 2018.10.31	අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති සභාපති - ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව	සභාපති ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව කොළඹ 07.
2	සරත් වීරසූරිය මහතා	2018.11.01 සිට 2018.11.08	අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති සභාපති - ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව	සභාපති ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව කොළඹ 07.
3	ජගත් මංජුල යාපා මහතා	2018.11.09 - 2019.09.01	අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති ,සභාපති - ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව	සභාපති ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව කොළඹ 07.
4	ආනන්ද බණ්ඩාර දිසානායක මහතා	2017.06.29 සිට 2017.06.06 දක්වා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ,ක්‍රියාකාරී අධ්‍යක්ෂ ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව	ක්‍රියාකාරී අධ්‍යක්ෂ ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව කොළඹ 07.
5	නීතිඥ නිලන්ත කුමාරගේ මහතා	2018.06.06 සිට 2018.11.08 දක්වා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ක්‍රියාකාරී අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව	ක්‍රියාකාරී අධ්‍යක්ෂ ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව කොළඹ 07.

6	සැමියන් කුමාරගේ මහතා	2018.11.09	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ක්‍රියාකාරී අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව සංස්ථාව	ක්‍රියාකාරී අධ්‍යක්ෂ ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව කොළඹ 07.
7	අනුෂා ගෝකුල ප්‍රනාන්දු මිය	2016.06.07,20 17.07.07	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිල බලයෙන්) සංස්කෘතික අධ්‍යක්ෂ - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	සංස්කෘතික අධ්‍යක්ෂ, සංස්කෘතික දෙපාර්තමේන්තුව , 08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල
8	මහාචාර්ය සේන නානායක්කාර	2018.11.08	**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**	නො: 99,නගර සභා නිවාස නව නගරය,අනුරාධපුරය
9	නිනිඳ සමන් වීරමන් මහතා	2018.11.08	**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**	නො 89,දියවන්නා ගාර්ඩන්ස්,පැලවත්ත,බත්තරමුල්ල
10	නදීකා ගුණසේකර මහතා	2018.11.08	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අංක 552බී,වෙස්බරි උද්‍යානය,අකුරේගොඩ, පැලවත්ත,බත්තරමුල්ල
11	ඒරානන්ද හෙට්ටිආරච්චි මහතා	2016.06.07	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික(නිල බලයෙන්) අධ්‍යක්ෂ ජනරාල්- ගුවන් විදුලි සංස්ථාව	අධ්‍යක්ෂ ජනරාල් - ගුවන් විදුලි සංස්ථාව කොළඹ 07
12	නාලක කළුවැව මහතා	_	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිල බලයෙන්) අධ්‍යක්ෂ ජනරාල් - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව	ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.කොළඹ 05
13	ආචාර්ය ටියුඩර්වීරසිංහ	2018.11.08	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	නො,94,කලුතර,බණ්ඩාරගම
14	ඩී.එම්.ඩී.එන්.බාලසූරිය මිය	2017.03.17 2017.07.07	භාණ්ඩාගාර නියෝජිත අධ්‍යක්ෂ - කළමනාකරණ සේවා දේපාර්තමේන්තුව	අධ්‍යක්ෂ, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව,මහ ලේකම් කාර්යාලය. කොළඹ 01
15	තිරෝමි සනෝජා බිබිලේ මෙනවිය	2017.06.29	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අංක,170/19,හැදල ,වත්තල
16	බෙනට් රත්නායක මහතා	2017.06.29	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	1028/2.නාගහමුල්ල පාර,බත්තරමුල්ල

17	පි.වී.පි.දයාරත්න මිය	2017.06.29	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අංක,59/3,හීනටිකුඹුර,තලංගම උතුර,බත්තරමුල්ල
18	නීතිඥ අනිල් රාජකරුණා මහතා	2018.06.06	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අංක,54/5බී,දෙවන පටුමග,එදිරිසිංහ මාවත,මිරිහාන,නුගේගොඩ
19	නීතිඥ සුදර්ශන ගුණවර්ධන මහතා	2017.10.26	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිල බලයෙන්) අධ්‍යක්ෂ ජනරාල් - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව	ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.කොළඹ 05
20	ආචාර්ය කීර්ති බණ්ඩාර කොටගම	2017.06.29	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සභාපති - ජනතා වතු සංවර්ධන මණ්ඩලය	සභාපති ජනතා වතු සංවර්ධන මණ්ඩලය,අංක55/75,වෝක්ස්හෝල් පෙදෙස,කොළඹ 02.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සිඒඑස්/සි/එන්එෆ්සී/1/18/එෆ්ඒ

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2019 නොවැම්බර් 26 දින

සභාපති

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 7 හි 7 වන ඡේදය අනුව, භාණ්ඩාගාර බිල්පත් සහ ප්‍රති විකුණුම් බිල්පත් ගිණුම්ගත කිරීමේදී මාස 3 ක් හෝ ඊට අඩු ආයෝජනයක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් හා සමාන ද්‍රවශීල වත්කමක්ලෙස පෙන්නුම් කළ යුතු වුවද මාස තුනක කාලයක් තුළදී කල් පිරීමට නියමිත භාණ්ඩාගාර බිල්පත් වටිනාකම රු.9,669,041 ක් හා භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිවිකුණුම් (Repo) රු.103,293,173 ක් මුදල් හා මුදල් සමාන දෑ යටතේ දක්වා නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 79 (අ) ඡේදය ප්‍රකාරව නිෂ්කාර්ය වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ පොත් අගය හෙළිදරව් කළයුතු වුවත් සංස්ථාවේ කැලණිය චිත්‍රාගාරයේ කලුසුදු සහ වර්ණ රසායනාගාරවලට අයත් තාක්ෂණය හා යල්පැනගිය පැරණි වත්කම්, ගිණුම්ගත කිරීම හා ඒ පිළිබඳව හෙළිදරව් කිරීම සිදුකර නොතිබුණි.

(iii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 හි 57 ඡේදය ප්‍රකාරව, ආයුගණක තක්සේරුවක් සිදුකර පශ්චාත් සේවක ප්‍රතිලාභ වෙන්කිරීම් ගණනය කළ යුතු වුවත්, ඊට පටහැනිව සංස්ථාව විසින් පශ්චාත් සේවක ප්‍රතිලාභ වෙන්කිරීම් සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගැනීමකින් තොරව සෑම සේවකයෙකුටම සේවය කරන ලද එක් වර්ෂයකට මාස භාගයක වැටුපට සමාන පාරිතෝෂික මුදලක් වෙන් කර තිබුණි.

(iv) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38 හි 119 ඡේදය ප්‍රකාරව කැලණිය සරසවි චිත්‍රාගාරයේ පශ්චාත් නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා කරන මෘදුකාංගය මූල්‍ය ප්‍රකාශනවල අස්පෘශ්‍ය වත්කම් යටතේ දක්වා නොතිබුණි.

(v) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 40 හි 75 (ඇ) ඡේදය ප්‍රකාරව, ආයෝජන වත්කම් හඳුනාගෙන ගිණුම් ගත කළ යුතු වුවත් සංස්ථාව විසින් වර්ෂ 16 කට වැඩි කාලයක සිට රූගම් පාලක මණ්ඩලයට, සැලසිනේ ආයතනයට සහ සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයට කුලියට ලබාදී ඇති ගොඩනැගිල්ල පිළිබඳව සුදුසු අනාවරණය කිරීම් සිදුකර නොතිබුණි.

(ආ) සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම

1999 වර්ෂයේ දී සංස්ථාව සතුව පැවති චිත්‍රපටි බෙදාහැරීමේ ඒකාධිකාරය අහෝසි කිරීමත් සමඟ සංස්ථාව සතුව පැවති ප්‍රධාන ආදායම් මාර්ගයක් වූ බෙදා හැරීමේ කොමිස් මුදල අහිමි වී තිබුණි. ඒ හේතුවෙන් සංස්ථාවේ ආදායම, වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් නොවීම මත මහාභාණ්ඩාගාරය විසින් 2001 වර්ෂයේ සිට සේවක වැටුප් සඳහා ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක කාලය තුළ භාණ්ඩාගාර ප්‍රදාන ලැබීමට පෙර සංස්ථාව දිගින් දිගටම අලාභ ලබා තිබුණු අතර රජයේ මූල්‍ය සහායක් නොමැතිව සංස්ථාව අඛණ්ඩව පවත්වා යාම අවිනිශ්චිත තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) ගිණුම්කරණ අඩුපාඩු

දේපල ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තිය පිරිවැයට හෝ තක්සේරු අගයට බව මූල්‍ය ප්‍රකාශන වල හෙලිදරව් කර තිබුණද සංස්ථාවට අයත් බෞද්ධාලෝක මාවතේ පිහිටි වරිපනම් අංක 224 ඉඩම සහ කැලණිය චිත්‍රාගාරයේ ඉඩම තක්සේරු කර සාධාරණ අගය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) නොසැසඳූ ගිණුම් ශේෂ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සංස්ථාව විසින් චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන් සඳහා වූ අරමුදල, චිත්‍රපට සංවර්ධන අරමුදල හා රිත්මා මණ්ඩලය සමඟ පවත්වාගෙන යන ජංගම ගිණුම් 03 ක් හා එම අරමුදල්වල ජංගම ගිණුම් අතර 2018 දෙසැම්බර් 31 දිනට පැවති පැහැදිලි නොකළ ශේෂ වෙනස්කම්වල එකතුව රු9,117,914 ක් විය.

(ii) මූල්‍ය ප්‍රකාශන අනුව වැටුප් හා වේතන, සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායකමුදල් හා වෙනත් දීමනා ලෙස රු.75,776,603 ක් දක්වා තිබුණද මාසික වැටුප් පත්‍රිකා එකතුව අනුව එය රු.67,693,662 ක් වූයෙන් රු.8,082,941 ක වෙනසක් විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර,කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහඟරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (අ) (ii), 1.2 (අ) (iii), 1.2 (අ) (iv), 1.2 (අ) (v) ,1.2 (ආ) , 1.2 (ඇ), 3(අ)(ii) හා 3 (අ) (iv) ඡේද හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති, විධානයට යොමුව	විස්තරය
(අ) 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 27 වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 10(5) සහ 11 වගන්ති	2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ ආදායම් අතිරික්තය රු.141,934,127 ක් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණු අතර මුදල් ඇමතිවරයාගේ හා අදාළ ඇමතිවරයාගේ අනුමැතියකින් තොරව රු.108,004,238 ක් හා රු.187,811,682 ක් පිළිවෙළින් භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිවිකුණුම්වල ආයෝජනය කර තිබුණි.
(ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ 7(2) වගන්තිය	සමාලෝචිත වර්ෂයේදී ලැබුණු රු. 63,850,000 ක් වූ රජයේ ප්‍රදාන සංස්ථාවේ ලාභය/ අලාභය ගණනය කිරීමෙන් පසුව විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ පෙන්වා තිබුණි.
(ඇ) 1999 ජුනි 17 දිනැති ජාතික චිත්‍රපට ප්‍රතිපත්තිය හා මාර්ගෝපදේශය 9 ඡේදය	චිත්‍රපට සුරක්ෂිතාගාරයක් පිහිටුවා එහි කළමනාකරණය සංස්ථාව විසින් පවත්වාගෙන යා යුතු වුවත් සංස්ථාව සතු පැරණි චිත්‍රපට 273 ක් ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සුරක්ෂිතාගාරයක තැන්පත් කර තිබුණු අතර 1947 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ තිරගත වූ චිත්‍රපට 987 ක් සහ නව චිත්‍රපටවල පිටපත් සුරක්ෂිත කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස්කර නොතිබුණි.
(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.381 (1)	රාජකාරී බැංකු ගිණුම් ආරම්භ කිරීම සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා මගින් මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වුවත්, 2018 දෙසැම්බර් 31 දින වනවිට භාණ්ඩාගාර අනුමැතියකින් තොරව බැංකු ජංගම ගිණුම් 09 ක් ආරම්භ කර තිබුණු අතර එදිනට එම බැංකු ගිණුම්වල පැවති ශේෂ එකතුව රු.35,903,847 ක් විය.
(ඉ) 2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එම මූල්‍ය ප්‍රකාශන මාස 05 දින 07 ක ප්‍රමාදයකින් පසුව 2019 අගෝස්තු 07 දින ඉදිරිපත් කර තිබුණි.

(ඊ) 2014 අංක 7 දරන එකතු කළ අගය මත බදු පනතේ 4(1) (ආ) වගන්තිය

සේවා සැපයුමක අත්තිකාරම් මුදල් සඳහා එකතුකළ අගය මත බදු ගෙවිය යුතු වුවත් සංස්ථාව විසින් අත්තිකාරම් මුදල් සඳහා එකතුකළ අගය මත බදු අය කර නොගෙන 2019 අගෝස්තු 07 දින එකතු කළ අගය මත බදු සඳහා පමණක් රු.4,357,404 ක වවුවරයක් පිළියෙළ කර ගෙවා තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) **අධිකාරිය නොලත් ගනුදෙනු**

2006 ජනවාරි සිට 2015 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයේදී ජීවන වියදම් දීමනාව නොසලකා සේවක අර්ථ සාධක අරමුදල සඳහා දායකමුදල් ගණනය කිරීම හේතුවෙන් සේවායෝජකයාගේ දායකය රු.12,211,657 ක්, සේවකයාගේ දායකය රු.8,141,105 ක් හා ඒ මත අධිභාරය රු.10,176,381 ක් ගෙවීමට ඇති බව නඩු පැවරීමට පෙර කරනු ලබන අවසාන නිවේදනය මගින් දන්වා තිබුණි. ඊට අමතරව සේවනියුක්තයන්ගේ භාර අරමුදල සඳහා දායක මුදල් රු.2,763,753 ක් හා ඒ මත අධිභාරය රු.1,381,876 ක් අයවිය යුතු බව සංස්ථාවට දන්වා තිබුණි. කෙසේ වෙතත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව ඉකුත් වර්ෂ ගැලපීම් ලෙස සම්පූර්ණ ගෙවීම සඳහා රු.34,674,772 ක් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා තිබුණි. තවද අධිභාරය රු.11,558,257 ක් භාණ්ඩාගාරයට වැය බරක් නොවන පරිදි ගෙවන ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් දන්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව,

(අ) **ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැර වීම.**

ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 5.6 ක් වූ කාර්යාලීය ලී බඩු මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන අනුගමනය කර නොතිබීම, සපයා තිබුණු ලී බඩු නියමිත පිරිවිතරයන්ට අනුකූල නොවීම හා ඇනවුම් කළ ලී බඩු ප්‍රමාණයන් නිසිකලට සපයා නොතිබීම යනාදී

හේතූන් මත ප්‍රසම්පාදන කටයුතු 2019 ජූලි 30 දින වන විටත් සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබුණි.

3 වෙනත් නිරීක්ෂණ

(අ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) චිත්‍රපට නිෂ්පාදනය සඳහා චිත්‍රපට නිෂ්පාදකවරුන් වෙත 1975 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ ගෙවූ ණය වටිනාකමෙන් 2018 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 71.32 ක අයවිය යුතු ශේෂයක් පැවතුණි. එම ණය වලින් රු.මිලියන 25.10 ක් චිත්‍රපට නිෂ්පාදනය සඳහා උපයෝජනය කර නොතිබුණු අතර රු.මිලියන 8.29 ක හිඟ ණය ශේෂයන්ට අදාළ නිෂ්පාදකවරුන් මියගොස් සිටීම හේතුවෙන් ණය අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි. වර්ෂ 10 කට වැඩි කාලයක් කල්ගතවීම මත ණය අයකර ගැනීමේ නෛතික හැකියාව හීන වී තිබුණු අතර චිත්‍රපට සංස්ථාවට චිත්‍රපටවල අයිතිය පවරා ගෙන රු.මිලියන 11.84 ක් වූ හිඟ හිටි ණය ශේෂයයන් කපා හැරීමට යෝජිතව තිබුණද එම කටයුතු ක්‍රියාත්මක කිරීමේ දුර්වලතාවයන් මත කටයුතු ඇනහිට තිබුණි.

(ii) මරදාන සිනේසිටි සිනමා ශාලාවෙන් 2003 වර්ෂයේ සිට 2016 මැයි 31 දින දක්වා අයවිය යුතු චිත්‍රපට කුලිය රු. 12,343,433 ක් 2019 ඔක්තෝබර් 15 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර 2016 මැයි 31 දිනට පසු දෛනික වාර්තා ගෙන්වා ගැනීමට පියවර ගෙන නොතිබීම හේතුවෙන් අයවිය යුතු චිත්‍රපට කුලී ආදායම ගණනය කිරීමට සහ ගිණුම්ගත කිරීමට නොහැකි වී තිබුණි.

(iii) සිනමාශාලා වෙත 2018 වර්ෂයේ පැනවූ දඩ මුදල් රු.263,940 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.693,480 ක් වූ එනම් සියයට 38 ක දඩ මුදල් අයකර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

(iv) සේවකයින් විශ්‍රාම ගැන්වීම වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු වන්දි මුදලින් ඉතිරිව පැවති රු. 5,000,000 ක් වර්ෂ 05 කට වැඩි කාලයක් ඉකුත් වී තිබුණද නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(v) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සිනමාහල් නිෂ්පාදන, වෙනත් ණය සහ සේවක අත්තිකාරම් වශයෙන් මුළු ණය එකතුව රු. 640,544,569 ක් අයකරගත යුතුව තිබුණි. එම ණයගැතියන්ගෙන් රු.160,843,048 ක් වූ එකඟ නොවූ සහ අයකරගත නොහැකි ණය ශේෂය සඳහා සියයට 100 ක බොල් ණය ප්‍රතිපාදනයක්ද ඉතිරි ණයගැතියන් සඳහා සියයට 5 ක බොල්ණය ප්‍රතිපාදනයක්ද සිදුකර තිබුණි. කෙසේ වුවද ඉහත ණයගැතියන් ගෙන් රු.183,660,809 ක් එනම් සියයට 29 ක් ආපසු අයකර ගැනීම අවිනිශ්චිත බව නිරීක්ෂණය විය.

(ආ) ආර්ථික නොවූ ගනුදෙනු

(i) භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිවිකුණුම්වල වටිනාකම රු.295,820,920 ක් වූ අතර ප්‍රාථමික වෙළඳපලේ රාජ්‍ය බැංකු වලින් මිල ගණන් කැඳවා වඩා වාසිදායක පොලී අනුපාත මත අතිරික්ත අරමුදල් ආයෝජනය කරනු වෙනුවට එක් බැංකුවක දිගින් දිගටම ආයෝජනය කර තිබුණි.

(ii) සංස්ථාවට අයත් අංක 224 ගොඩනැගිල්ල රජයේ කුලී තක්සේරු අනුව කුලී ගාස්තු තීරණය කිරීමෙන් තොරව අඩු කුලී ගාස්තුවක් මත රජයේ ආයතන දෙකකට බදුදීම හේතුවෙන් 2018 වර්ෂයේදී සංස්ථාවට රු. 1,722,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

(ඇ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

(i) සංස්ථාව සතු බැංකු ජංගම ගිණුම් 9 ක 2018 වර්ෂයේ සාමාන්‍ය මාසික ශේෂය රු.මිලියන 64.2 ක් වූ අතර එම මුදල් ඵලදායී ලෙස කෙටිකාලීනව ආයෝජනය කර අමතර ආදායම් ලබාගැනීම සඳහා අවධානය යොමුකර නොතිබුණි.

(ii) එකතුව රු.870,659 ක් වූ දළ සේයාපට සහ රසායන ද්‍රව්‍ය තොගය 2014 වර්ෂයේ සිට නිකුත් කිරීමකින් තොරව පැවති අතර දළ සේයා පට කල් ඉකුත් වීම මත ප්‍රයෝජනයට ගැනීමට නොහැකි තත්ත්වයකට පත්වී තිබුණි.

(ඉ) මතභේදයට තුඩුදෙනු ඇතුදෙනු

සංස්ථාවේ අරමුණු වලට කිසිදු සම්බන්ධතාවයක් නොමැති සහ පදනම් කරගත් නෛතික විධිවිධානයකින් තොරව සංස්ථාවේ සභාපතිවරයා විසින් රිත්මා මණ්ඩලයේ සිනමාශාලා සඳහා වර්ෂ කිහිපයක සිට සහ අනෙකුත් මණ්ඩලවල සිනමාශාලා 40 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ සිට රටබීම බලපත්‍ර නිර්දේශ කර තිබුණි. කෙසේ වෙතත් 2019 මැයි 22 දිනැති අංක අමප/19/1240/122/045 අමාත්‍ය මණ්ඩල තීරණය අනුව "සිනමා ශාලාවල මත්පැන් බලපත්‍ර සඳහා නිර්දේශ නිකුත් කිරීම අත්හිටුවීමට" තීරණය කර තිබුණද ඒ අනුව මෙම තීරණය දැනුම් දීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කර නොතිබුණි.

(ඊ) ඉටු නොකළ ව්‍යාපෘති

සිනමා කර්මාන්තයේ උන්නතිය උදෙසා දළුගම සරසවි චිත්‍රාගාරය වැඩි දියුණු කිරීම, චිත්‍රපට දෙබස් පටිගත කිරීමේ මැදිරිය, සංස්කරණ මැදිරිය, ශබ්ද මිශ්‍රණ මැදිරිය, සිනමා පුස්තකාලය, බී.ඒ.ඩබ්ලිව්.ජයමාන්න මැදිරිය ඉදිකිරීම යනාදී ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 125 ක් ඇස්තමේන්තුගත කර තිබුණද කළමනාකරණ අකාර්යක්ෂමතාවයන් හා අරමුදල් සම්පාදනය කර ගැනීමේ ක්‍රියාමාර්ගයන් පිළිබඳව අවධානය නොකිරීම හේතුවෙන් ඉකුත් වර්ෂ 03 පමණ කාලයක සිට ඉලක්ක ගත කර තිබුණු එම ව්‍යාපෘති ඉටු නොකර අත්හැර දමා තිබුණි.

(උ) අභ්‍යන්තර විගණනය

අනුමත කාර්යය මණ්ඩලයට අනුව අභ්‍යන්තර විගණන අංශයේ ස්ථිර විගණන සහායක තනතුරු 03 ක් පැවතියද, 2018 දෙසැම්බර් 31 දින වන විට කිසිදු සහායකයකු සේවයේ යොදවා නොතිබුණි. ඒ අනුව අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඌ) වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව 2016 හා 2017 වර්ෂවල වාර්ෂික වාර්තා 2019 ඔක්තෝබර් 24 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

(ඔ) කාර්ය මණ්ඩල පරිපාලනය

(i) 2018 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ කාර්යය මණ්ඩල පුරප්පාඩු සංඛ්‍යාව 81 ක් වූ අතර වර්තමාන අවශ්‍යතාවයන් අනුව අනුමත කාර්ය මණ්ඩලය සමාලෝචනය කර නොතිබුණි. ඒ අනුව, අත්‍යාවශ්‍ය මණ්ඩලික තනතුරු 03 ක්, දීර්ඝ කාලයක සිට පුරප්පාඩු වී පැවතුණි. තවද සංස්ථාවේ සාමාන්‍යාධිකාරී තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි.

(ii) සංස්ථාවේ කම්කරුවන් 08 දෙනෙකුගේ අතිරික්තයක් පැවතියදී සංස්ථාවේ පිරිසිදුකිරීම් කටයුතු පෞද්ගලික සමාගමක් මගින් සිදුකෙරෙමින් පැවතුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති